

# සෞභාග්‍යවත් අනාගතයක් ගොඩනගමු

HDFC BANK

*The Housing Bank...*

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | වාර්ෂික වාර්තාව 2013

# පටුන


| | |
|---|---|
| වසරේ සුවිශේෂතා | 2 |
| සභාපතිනියගේ විමර්ශනය | 4 |
| සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ විමර්ශනය | 8 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 13 |
| විගණන කමිටු වාර්තාව | 18 |
| අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටු වාර්තාව | 19 |
| නාමයෝජනා කමිටුව | 20 |
| ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව | 21 |
| මූල්‍යමය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 22 |
| විගණකාධිපති වාර්තාව | 23 |
| ආදායම් ප්‍රකාශය | 25 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 26 |
| මූල්‍යමය තත්ව ප්‍රකාශය | 27 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 28 |
| කොටස් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය | 29 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 30 |
| මූල්‍යමය උපකරණ ඇගයීම | 34 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය | 52 |
| ශේෂ පත්‍ර ප්‍රකාශනය මත අවදානම ගැළපීම | 53 |
| කොටස් පිළිබඳ විස්තර | 54 |
| අගය එකතු කිරීම් ප්‍රකාශය | 57 |
| දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය | 58 |
| වාර්ෂික මහා සභා රැස්වීම සඳහා වන නිවේදනය | 59 |

# සෞභාග්‍යවත් අනාගතයක් ගොඩනගමු

වසර ගණනාවක් තිස්සේ නිවාස සඳහා මූල්‍යමය ප්‍රතිපාදන ලබාදීම ඔස්සේ ශ්‍රී ලංකිකයින්ගේ ජීවන රටාවන් ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව දිවයින පුරා විසිරුනු දහස් සංඛ්‍යාත පවුල්වල ජීවන තත්ත්වය උසස් කිරීමෙහිලා දායක වී ඇත. අද වන විට අප විසින් එම දායකත්වය තවදුරටත් ඉදිරියට ගෙන යමින් නව විවිධාංගීකෘත ව්‍යාපාරික ක්‍රමෝපායක් සහ තිරසාර ව්‍යාපාරික දර්ශනයක් ඔස්සේ ඔවුන්ගේ හිසට සෙවණක් ලබාදීමට අපි කැප වී ක්‍රියා කරන්නෙමු. ලොව වෙත විශ්වාසයෙන් යුතුව මුහුණදෙමින් සාර්ථකත්වයේ සිහින සැබෑ කරගැනීමට ශ්‍රී ලංකාවේ අනාගත පරපුරට අවැසි පදනම සැකසීම සඳහා දායක වීමට හැකිවීම පිළිබඳව අප හට සැබැවින්ම අභිමානයකි.

# වසරේ සුවිශේෂතා

- දිගු කාලීන මූල්‍යමය තිරසාරත්වය සඳහා වන නව ව්‍යාපාර ආකෘතිය ක්‍රියාවේ යෙදවීනි.
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි පළමු අති සාර්ථක ණයකර නිකුතුව.
- Ram රේටිං ලංකා මගින් BBB ශ්‍රේණිගත කිරීම සිදුකිරීම
- නව අගය එකතු කළ සැලසුම් රැසක් හඳුන්වාදීම.
- තිස්සමහාරාම නව ශාඛාව සමගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම.
- අපගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 800 දක්වා ව්‍යාප්ත කිරීම.
- ගනුදෙනුකරුවන් 23,000 ක් අතරේ රුපියල් මිලියන 6,700ක ඉතිහාසගත ණය ප්‍රමාණයක් ලබාදීම
- වසරින් වසර පදනම මත අපගේ බදු පෙර ලාභය 2013දී රුපියල් මිලියන 176 සිට රුපියල් මිලියන 336 දක්වා 91%කින් වර්ධනය වීම.
- වර්ධන තිරසාරත්වය උදෙසා නව ආයතනික සැලසුමක් සැකසීම.

ආදායම




ලාභ වර්ධනය
රුපියල් මිලියන




මුළු වත්කම්




ROA සහ ROE



| | **2013** **රු. මිලියන** | 2012 රු. මිලියන | වෙනස % |
|---|---|---|---|
| වසර සඳහා ප්‍රතිඵල | | | |
| ආදායම | **3,803** | 2,744 | 39 |
| බදු පෙර ලාභය | **309** | 176 | 76 |
| බදු සඳහා වෙන් කිරීම | **151** | 120 | 26 |
| බදු වලට පසු ලාභය | **158** | 56 | 185 |
| රජය වෙත ආදායම | **155** | 123 | 26 |
| දළ ලාභාංශ | | | |
| **වසර අවසානයේදී** | | | |
| කොටස් හිමිකාර අරමුදල | **2,575** | 2,391 | 8 |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පතු | **18,914** | 14,695 | 29 |
| ගනුදෙනුකරුවන් වෙත දළ ණය සහ අත්තිකාරම් | **20,112** | 16,290 | 23 |
| මුළු වත්කම් | **27,567** | 20,801 | 33 |
| **සාමාන්‍ය කොටසක තොරතුරු** | | | |
| ඉපැයුම් (මූලික) (රු.) | **2.44** | 0.86 | 185 |
| **මූල්‍යමය අනුපාත** | | | |
| සාමාන්‍යය කොටස් හිමිකරුවන්ගේ අරමුදල මත ආදායම | **6.36** | 2.35 | 171 |
| සාමාන්‍යය වත්කම් මත ආදායම | **0.65** | 0.27 | 140 |
| මුළු වත්කම් වලට කොටස් හිමිකරුවන්ගේ ස්කන්ධ | **9.34** | 11.50 | (19) |
| **ව්‍යවස්ථාපිත අනුපාත** | | | |
| ද්‍රවශීල වත්කම් ( % ) | **28.74** | 22.65 | 27 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය - | | | |
| මට්ටම 1 - අවම අවශ්‍යතාවය 5% | **17.74%** | 23.75% | (25) |
| මට්ටම 11 - අවම අවශ්‍යතාවය 10% | **18.29%** | 24.41% | (25) |
| **වෙනත් තොරතුරු** | | | |
| ශාඛා | **33** | 32 | 3 |
| සේවකයින් (සංඛ්‍යාව) | **488** | 488 | - |
| ණය ශ්‍රේණිගත කිරීම - Fitch Rating/ RAM Rating | **BBB** ස්ථාවර | BBB ස්ථාවර | |



# සභාපතිනියගේ විමර්ශනය

"වසර 2013 ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවටකැපී පෙනෙන වසරක් වේ. එයට හේතුව වූයේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සිය මෙහෙයුම් පරාසය පුළුල් කරමින් නව වෙළඳපළ වෙත පිවිසීමයි."



අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් වසර 2013 සඳහා වන වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරමි. 2013 ජනවාරි මස බැංකුව සමග එක්ව අභියෝගාත්මක වසරක් තුළ බැංකුවට නිසි මාර්ගෝපදේශකත්වය සපයන ලද පරිණත බැංකු නිලධාරියකු වන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි අභිනව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී නිමල් මාමඩුව මහතා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

බැංකුව මගින් සිය සේවාවන් සමූහය ව්‍යාප්ත කරමින් මෙතෙක් නොපිවිසි වෙළඳපළ වෙත ඇතුළු වෙමින් සිය මෙහෙයුම් පරාසය පුළුල් කිරීම හේතුවෙන් වසර 2013 ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට කැපී පෙනෙන වසරක් වේ. මෙය එසේ සිදුවූයේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත සංශෝධනය කරමින් එතෙක් නිවාස සඳහා මූල්‍ය සම්පාදනය පමණක් සිදුකිරීමේ සීමිත අභිලාෂයන් ඉවත් කරමින් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට සිය මෙහෙයුම් පරාසය පුළුල් කිරීම සඳහා අවස්ථාව ලබාදීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙමගින් ජනතාවගේ නිවාස මූල්‍ය අවශ්‍යතාවන්ට සීමානොවී ඔවුන් ආර්ථික වශයෙන් නගා සිටුවීම සඳහා සහාය දැක්වීමේ හැකියාවද ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට හිමි විය. එමනිසා අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ නව සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ නිසි මාර්ගෝපදේශකත්වය යටතේ කල්බදු, ක්ෂුද්‍ර මූල්‍ය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ අධ්‍යාපන ක්ෂේත්‍රයන් වෙත පිවිසීමෙන් නව්‍ය වර්ධනීය ගමන් මගකට අවතීර්ණ වීමට නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට හැකි විය. මෙහිදී ප්‍රවේශම් සහගත අයුරින් වුවද අපගේ රන් ණය ව්‍යාපාර මෙහෙයුම් සිදුකිරීමට අපි සමත්වීමු අප විසින් 2012දී රන් මත නිවාස ණය ලබාදීමේ සේවාව අරඹන ලද අතර 2013 වසරේදී රන් මිළ හදිසියේ පහත වැටුනද අපගේ රන් ණය සේවාවන් වර්ධනය වූයේ අවම හානි සමගිනි. එමනිසා මාගේ අදහස වනුයේ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් යටතේ සිදුකළහොත් රන් මත නිවාස ණය ලබාදීමේ ආකෘතිය තිරසාර සැළසුමක් වනු ඇති බවයි. අපගේ රන් මත ණය ලබාදීමේ සේවාව නිල බැංකු ණය සේවාවන් ලබාගැනීමේ අසීරුතා සහිත අව වරප්‍රසාදිත ප්‍රජාවන් වෙත නිවාස ණය ලබාදෙමින් සමස්ත සමාජීය සුබසාධන කර්තව්‍යයක් වශයෙන්ද හැඳින්විය හැක.

### අපගේ කාර්යසාධනය

වසර 2013 අපගේ කාර්යසාධනය පිළිබඳව අවධානය යොමුකිරීමේදී බැංකුවේ සාර්ථකත්වයන් අතිශය ප්‍රශංසනීය බව පැහැදිලි වේ. කැපී පෙනෙන විවිධාංගීකරණයක් සිදුකරන ලද මෙම පළමු වසරේදීම බැංකුවේ ලාභදායීත්වය ඉහළ ගිය බවත් බදු පෙර ලාභය රුපියල් මිලියන 309 දක්වා 76%කින්ද බදු වලට පසු ලාභය රුපියල් මිලියන 158 දක්වා 182%කින්ද ඉහළ ගිය බවත් ප්‍රකාශයට පත් කරන්නේ ඉමහත් සතුටිනි. අපගේ දැනට සිටින ගනුදෙනුකරුවන් තුළ ක්ෂුද්‍ර මූල්‍ය සහ සුළු හා මධ්‍ය පරිමාණ ණය පහසුකම් සම්බන්ධ දැඩි උනන්දුවක් දැකිය හැකි වන අතර නව මූල්‍ය වර්ෂයේදී අපගේ කල්බදු සැලසුම් කෙරෙහි වැඩි අවධානයක් යොමු වනු දක්නට ලැබේ. අපගේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වෙළඳපළ වෙත ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත කෙරුණද පැහැදිලි සැලසුම් පෙළක් පවත්වා ගෙන යාමට හැකිවීම විශේෂත්වයකි. ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය සමග රාජ්‍ය අංශය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද ජන සෙවන ව්‍යාපෘතියේදී නැවත ගෙවීම් පැහැර හැරීම් කිසිවක් වාර්තා නොවීමද විශේෂත්වයකි.

බැංකුව මගින් අත්කර ගන්නා ලද ණය ලබාදීමේ වර්ධනය මගින් නිවාස ක්ෂේත්‍රය සහ දිවයිනේ පහළ හා මධ්‍යම ආදායම්ලාභීන්ගේ උන්නතිය සඳහා බැංකුව දක්වන ප්‍රශාසනීය දායකත්වය විදහා දක්වේ. අපගේ ව්‍යාපාර ආකෘතිය ඔස්සේ නිවාස සඳහා මූල්‍ය පහසුකම් සැලසීම ඔස්සේ සමාජයේ සැළකිය යුතු පුද්ගලයින් සහ පවුල් සංඛ්‍යාවකගේ ජීවන තත්වය ඉහළ නැවීමට අප සමත්ව ඇත. සුරක්ෂිතතාව සමාජ තත්වය සහ පවුල් උරුමය අතින් පවුලක් සඳහා වන නිවස අතිශය වැදගත් කොට සළකන ශ්‍රී ලංකා සංස්කෘතිය තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මගින් දහස් සංඛ්‍යාත පවුල් සහ දරුවන් වෙත විශ්වාසයෙන් යුතුව සමාජය වෙත මුහුණදීමේ අවස්ථාව උදා කොට ඇත. මූල්‍යමය වශයෙන් අසීරුතාවන්ට පත් ජනතාව සමග දශක තුනකට අධික කලක් තිස්සේ ලද අත්දැකීම් නිසාවෙන් ඔවුන්ගේ අවශ්‍යතා නිවැරදිව හඳුනාගනිමින් අදාළ ප්‍රජාවන්ගේ වටිනාකම් සහ හැකියාවන් පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමේ හැකියාව බැංකුව සතුව පවතී. එමනිසා විවිධ සමාජ තලයන්හි ආපසු ගෙවීමේ හැකියාවන්ට ගැළපෙන නිසි සැලසුම් ඉදිරිපත් කිරීම ඔස්සේ ආශ්‍රිත අවදානම් මග හරවා ගත හැකි බව අපි විශ්වාස කරමු.

තවත් සුබවාදී කරුණක් වනුයේ වසර 2012 පැවති ඉහළ පොළී අනුපාතයන් සමග සසඳන කල 2013දී නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත පහත වැටෙමින් පැවති පොළී අනුපාත හේතුවෙන් අපගේ ශුද්ධ පොළී තීරු කළමනාකරණයේදී සහනයක් හිමි විය. එහිදී සහයෝගී සාර්ව ආර්ථික වටපිටාවක් තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මගින් රුපියල් බිලියන 2ක වටිනාකමින් යුත් පළමු ණයකර නිකුතුවද සිදුකෙරිණි. ඒ සඳහා හිමි වූ අධි දායකත්වය මගින් මහජනයා සහ ආයතනයන් තුළ විශේෂිත රාජ්‍ය බැංකුවක් වශයෙන් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව කෙරෙහි පවතින විශ්වාසය මැනවින් විදහා දක්වේ. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු ණයකර නිකුතුව වෙත දායක වූ බහුතරයක් ආයතනික සමාගම් වීමද විශේෂත්වයකි. මෙය ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සහ එහි පාලන ව්‍යුහය මෙන්ම ශ්‍රී ලංකාවේ නිවාස වෙළඳපළ පිළිබඳව පවතින විශ්වාසය පිළිබඳ පැහැදිලි දර්ශකයකි.  ශ්‍රී ලංකාවේ නිවාස ක්ෂේත්‍රය නුදුරු අනාගතයේදී විශාල ප්‍රගතියක් අත්කරගනු ඇති බවත් දිගු කාලීනව එමගින් ආකර්ශනීය ආයෝජන අවස්ථාවන් සඳහා මං පෙත් විවිර වනු ඇති බවත් අපි විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරමු.

### ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මගින් ස්වයං ලෙස අභ්‍යන්තරව උත්පාදනය කරගන්නා ලද අරමුදල් උපයෝගී කරගනිමින් වසර තුළදී ඉහළ ගිය බැංකුවේ නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා සපුරාලන ලද බව ප්‍රකාශ කරනුයේ සතුටිනි. මහ බැංකුවේ කොන්දේසි වලට අනුකූලව 2013 අවසානයේ විශේෂිත බැංකුවක් මගින් රුපියල් බිලියන 2.5ක ප්‍රාග්ධන පදනමක් ගොඩනගා ගත යුතු විය. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වර්ධිත ලාභදායිත්වය ඔස්සේ මෙම ඉලක්කය පහසුවෙන් සපුරාලන ලද්දේ රුපියල් මිලියන 27,567ක් දක්වා වත්කම් පදනම 32%කින් ඉහළ නංවමිනි.

**"අපගේ ව්‍යාපාර ආකෘතිය ඔස්සේ නිවාස සඳහා මූල්‍ය පහසුකම් සැලසීම ඔස්සේ සමාජයේ සැළකිය යුතු පුද්ගලයින් සහ පවුල් සංඛ්‍යාවකගේ ජීවන තත්වය ඉහළ නැවීමට අප සමත්ව ඇත. සුරක්ෂිතතාව සමාජ තත්වය සහ පවුල් උරුමය අතින් පවුලක් සඳහා වන නිවස අතිශය වැදගත් කොට සළකන ශ්‍රී ලංකා සංස්කෘතිය තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මගින් දහස් සංඛ්‍යාත පවුල් සහ දරුවන් වෙත විශ්වාසයෙන් යුතුව සමාජය වෙත මුහුණදීමේ අවස්ථාව උදා කොට ඇත."**

# සභාපතිනියගේ විමර්ශනය

**ඒකාබද්ධකරණ සැලසුම්**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සිය 2013 අයවැය කතාවේදී බැංකු ඒකාබද්ධකරණය තුළින් නිර්මාණය කළ යුතු සවිමත් මූල්‍යමය ක්ෂේත්‍රයක අවශ්‍යතාවය අවධාරනය කළේය. එහිදී මෙසේ ඒකාබද්ධ කෙරෙන්නා වූ කුඩා බැංකු මගින් වඩාත් ප්‍රායෝගික බැංකු ක්ෂේත්‍රයක් නිර්මාණය වනු ඇති බවට විග්‍රහ කෙරිණි. මෙම දර්ශනය අනුව යමින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවද ඒකාබද්ධකරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අනුමැතියන් මුදල් අමාත්‍යාංශයෙන් සහ මහ බැංකුවෙන් ලබාග නිමින් ඒ සඳහා සූදානමින් පසුවේ. මෙහි ප්‍රගතිය පිළිබඳව ඉදිරියේදී අපගේ ගෞරවනීය කොටස් හිමිකරුවන් වෙත දැනුම් දෙනු ඇත.

**අනාගත වර්ධන ස්වරූපය**

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මේ වන විට බැංකුවක් වශයෙන් වසර 10කද නිවාස ණය සම්පාදනයේ වසර 30කද අත්දැකීම් සපුරා ඇත. අපගේ නව සැලසුම් පෙළ ඉදිරිපත් කොට ඇත්තේ මෙම අත්දැකීම් පදනම් කර ගනිමිනි. එමනිසා අප හට අපගේ බැංකුකරණ නිපුණතා සහ සුදුසුකම් ලත් වෘත්තිකයින්ගේ පමණක් නොව විශේෂඥ දැනුම පිළිබඳ වන සාඩම්බර උරුමයක සවිබලයද හිමි වේ. අපගේ විවිධාංගීකරණ ක්‍රියාවලිය මෙම අනභිබවනීය ඉතිහාසය මත පිහිටා ඉදිරිපත් කොට ඇති අතර එමගින් නිසැකවම සමාජය සහ ආර්ථිකය වෙත වටිනාකම් රැසක් එක් වනු ඇත.

**ප්‍රණාමය**

ශ්‍රී ලංකාව සහ මෙරට මූල්‍යමය ක්ෂේත්‍රය පිළිබඳව වන පැහැදිලි දර්ශනය වෙනුවෙන් අතිගරු ජනාධිපති සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන් වෙත මාගේ ප්‍රණාමය පුද කරමි. භාණ්ඩාගාර ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් යන මහත්වරුන් වෙත මාගේ කෘතඥතාවය පළ කෙරේ. බැංකුවේ ප්‍රගතිය උදෙසා කැපවීමෙන් යුතුව කටයුතු කළ මාගේ අධ්‍යක්ෂක මණ්ඩලය සහ අපගේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී නිමල් මාමඩුව වෙත මාගේ ස්තුතිය මෙසේ පුද කරමි. එමෙන්ම බැංකුවේ උන්නතිය වෙනුවෙන් අප්‍රතිහත ධෛර්‍යයෙන් යුතුව කටයුතු කළ කළමනාකාරීත්වයට සහ කාර්ය මණ්ඩලයට මගේ කෘතවේදීත්වය හිමි වේ. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ කාර්ය මණ්ඩලයේ සුබසාධනය වෙනුවෙන් වෙහෙසුනු වෘත්තීය සමිති වෙත මාගේ හදපිරි ප්‍රණාමය පළ කරමි. බැංකුවේ නව ව්‍යාපාරික ආකෘතිය ක්ෂේත්‍රය තුළ ස්ථාපනය වන අතරතුර අප කෙරෙහි හිතෛෂීවන්තව අප හා රැඳුනු ගනුදෙනුකරුවන් හා කොටස් හිමිකරුවන් වෙත තුති පුදමින් ඔවුන් වෙත ඉදිරි වසර කිහිපය තුළ වර්ධනීය ප්‍රතිලාභ රැසක් හිමි වනු ඇති බවද විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරමි.



**සිරෝමි වික්‍රමසිංහ මහත්මිය**
සභාපතිනී

"ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මේ වන විට බැංකුවක් වශයෙන් වසර 10කද නිවාස ණය සම්පාදනයේ වසර 30කද අත්දැකීම් සපුරා ඇත. අපගේ නව සැලසුම් පෙළ ඉදිරිපත් කොට ඇත්තේ මෙම අත්දැකීම් පදනම් කර ගනිමිනි. එමනිසා අප හට අපගේ බැංකුකරණ නිපුණතා සහ සුදුසුකම් ලත් වෘත්තිකයින්ගේ පමණක් නොව විශේෂඥ දැනුම පිළිබඳ වන සාඩම්බර උරුමයක සවිබලයද හිමි වේ."

**සිරෝමි වික්‍රමසිංහ මහත්මිය**
සභාපතිනී

**2013 මැයි මස අප විසින් 2014 සිට 2016 දක්වා තෙවසරක ක්‍රමෝපායික සැළසුමක් සැකසීම ඇරඹිණි. එමනිසා දැන් අප සතුව වර්ධනය ඉලක්ක කොට ගත් පරිපූර්ණ ක්‍රමෝපායක් සහ ක්‍රියාකාරී සැලසුමක් පවතී.**

නිමල් ජේ. බී. මාමඩුව
ප්‍රවිනි/සාමාන්‍යාධිකාරී

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ විමර්ශනය

"විමර්ශනයට ලක්වන වසර තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි සම්ප්‍රදායික ව්‍යාපාරික ආකෘතිය වෙනසකට භාජනය කරමින් බැංකුව වෙත නව වර්ධනීය ආදායම් මාර්ග යන් විවර කළ කෙටිකාලීන ණය සැලසුම් රැසක් හඳුන්වාදීමට හැකිවිය..."



## ආර්ථික විමර්ශනය

වසර 2012 ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික ස්ථාවරකරණ පැකේජයෙන් අනතුරුව එළඹි 2013 වසර ශ්‍රී ලංකා ආර්ථිකයේ කැපී පෙනෙන ප්‍රගතීන් රැසක් අත්පත් කරගත් වසරක් වශයෙන් හැඳින්විය හැක. ප්‍රතිපත්තිමය පොළී අනුපාතයන් පහත දැමුනු අතර වෙළඳපළ පොළී අනුපාතයන් ප්‍රබල වශයෙන් පහත වැටිණි. මේ අතර පුද්ගලික අංශ ණය වර්ධනය වන විට රාජ්‍ය සමාගම් වෙත පිරිනැමුණු ණය මධ්‍යස්ථ තත්වයක පවත්වා ගැනිණි. සවිමත් ප්‍රාග්ධනිතය සහ ද්‍රවශීලතා තත්වයන් හේතුවෙන් බැංකුකරණ ක්ෂේත්‍රය ස්ථාවරව පැවති අතර ණය වර්ධනය සහ උද්ධමනය සතුටුදායක මට්ටමක පැවතිණි. කෘෂිකාර්මික සහ සේවා ක්ෂේත්‍රයන් සාමාන්‍යයෙන් සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කළ අතර මන්දගාමී ප්‍රදේශයන් මගින් ජාතික දළ දේශීය නිෂ්පාදිතය වෙත දක්වෙන දායකත්වය අඛණ්ඩව වර්ධනය විය. ජාතික දළ දේශීය නිෂ්පාදිතය වෙත ප්‍රමුඛ දායකත්වය දක්වනු ලබන ප්‍රදේශය වශයෙන් බස්නාහිර පළාත තවදුරටත් සිය ස්ථානය තහවුරු කළද, වඩාත් පුළුල් වර්ධනයක් සඳහා වූ රජයේ මැදිහත්වීම් හේතුවෙන් වසර 2013දී පිට පළාත් වෙතින් ආර්ථික ක්‍රියාවලිය වෙත සාධනීය සහභාගීත්වයක් දක්වීමේ දිරිගන්වන සුළු සංඥාවන් දක්නට ලැබිණි. රැකියා වියුක්තිය සහ දරිද්‍රතා දර්ශක තවදුරටත් පහල මට්ටමක පැවතිණි. මෙම ධනාත්මක සාර්ව ආර්ථික තත්වයන් තුළ නිවාස ණය සඳහා ඉහළ ශක්‍යතාවක් සමගින් බැංකුකරණය සඳහා දිරිගන්වන සුළු වටපිටාවක් නිර්මාණය විය. ඒ අතරම වසර 2013දී දකුණු ආසියාව තුල දැඩි ආර්ථික අස්ථාවරත්වයක් පෙන්නුම් කළ අතර සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් අතර කළාපීය උද්ධමනය ඉහළම මට්ටමේ පැවතිණි. මෙම අභියෝගාත්මක ජාත්‍යන්තර ආර්ථික වටපිටාව හමුවේ වුවද ශ්‍රී ලංකාව සිය ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගනිමින් දළ දේශීය නිෂ්පාදිතයෙහි 7.2%ක වර්ධනයක් වාර්තා කළේය.

## බැංකුකරණ ක්ෂේත්‍රයෙහි කාර්යසාධනය

වසර 2013දී බැංකුකරණ ක්ෂේත්‍රය ව්‍යාපාරික පරිමාව සහ ගනුදෙනුකරුවන් වෙත ළඟාවීම යන දෙඅංශයෙන්ම ව්‍යාප්තියක් සනිටුහන් කළ අතර බැංකුකරණ ඝනත්ව ශ්‍රේණිගත කිරීම් අනුව දිවයිනේ අවම මට්ටමේ පැවති උතුරු පළාත ඉහළම මට්ටම කරා ළඟා විය. දේශීය ණය වෙත සහ කොටස් වෙළඳපළ වෙත අරමුදල් සම්පාදනය හා විදේශ ණය ලබාගැනීම් සඳහා වූ මෑත කාලීන මෙහෙයුම සමගින් බැංකුකරණ ක්ෂේත්‍රයෙහි අරමුදල් සම්පාදන ව්‍යුහය ආශ්‍රිතව වෙනස්වීම් ක්‍රියාවලියක ආරම්භය සනිටුහන් කෙරිණි. බැංකුකරණ ක්ෂේත්‍රය මගින් සිය ශේෂපත්‍රයන්හි සවිමත්භාවය මත විදේශ ණය ලබාගැනීම් ඔස්සේ සිය ප්‍රග්ධනය වසර 2012 පැවති ඇමරිකානු ඩොලර් මිලියන 973ට සාපේක්ෂව වසර 2013දී ඇමරිකානු  ඩොලර් මිලියන 1,548.3ක දක්වා ඉහළ නංවා ගන්නා ලද අතරම ක්ෂේත්‍ර දර්ශකයේ ස්ථාවරත්වයක් දිගින් දිගටම පෙන්නුම් කරන ලදී. නියාමන පාර්ශවයෙන් සළකන කල වසර 2013දී ප්‍රධාන ප්‍රතිපත්ති කිහිපයක් යොදාගැනුනු අතර ක්ෂුද්‍ර හා සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති සැකසුම වෙත සහාය දක්වීම උදෙසා මූල්‍යමය අවදානම් තක්සේරුකරණ ක්‍රමවේදයන් ගණනාවක් භාවිත කෙරිණි.

**අපගේ කාර්යසාධනය**

2012 වාර්ෂික වාර්තාවේ මාගේ පණිවුඩය තුළ ඔබගේ බැංකුවේ විවිධාංගීකරණ ක්‍රමෝපාය මගින් දිගුකාලීන තිරසාර වර්ධනය සහ අනාගත වර්ධනය අපේක්ෂා කිරීම සම්බන්ධ ක්‍රමෝපායික විසඳුමක් ඉදිරිපත් වන බව මම පැහැදිලිව සඳහන් කළෙමි. ඒ අනුව විමර්ශනයට ලක්වන වසර තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි සම්ප්‍රදායික ව්‍යාපාරික ආකෘතිය වෙනසකට භාජනය කරමින් අපගේ සැලසුම් පෙළ පුළුල් කරමින් බැංකුව වෙත නව වර්ධනීය ආදායම් මාර්ගයන් විවර කළ කෙටිකාලීන ණය සැලසුම් රැසක් හඳුන්වාදීමට හැකිවූ බව සතුටින් ප්‍රකාශයට පත් කරමි. ඉහත සඳහන් කරන ලද මෙකී නව සේවා කාණ්ඩයන් වනුයේ කල්බදු, ක්ෂුද්‍ර මූල්‍ය ණය, සුළු හා මධ්‍ය පරිමාණ ණය සහ අධ්‍යාපනික ණය සැලසුම් වේ. මෙම නව සැලසුම් පෙළ මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙනත් බැංකු සමග තරගකාරී තත්වයකට පත් කරන ලද අතර එමගින් වඩාත් නම්‍යශීලී සේවා පෙළක් සහ වඩාත් පුළුල් මෙහෙයුම් කෂේත්‍රයක් නිර්මාණය කෙරිණි.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වසර ගණනාවක් තිස්සේ ග්‍රාමීය හා නාගරික ප්‍රජාව සමග කටයුතු කිරීමෙන් ලද පරිචය තුලින් අපගේ ක්ෂුද්‍ර මූල්‍ය, සුළු හා මධ්‍ය පරිමාණ ණය වඩාත් බලාත්මක අයුරින් මෙහෙය වීමට හැකි වූ අතර එමගින් අදාල ප්‍රජාවන් වෙත පරිපූර්ණ වූ මූල්‍යමය සේවාවන් රැසක් ලබාදීමේ හැකියාව අප වෙත හිමි විය. අපගේ කල්බදු සේවාවන්ද අපගේ පරිපූර්ණ මූල්‍යමය සේවා ආකෘතිය වෙත අන්තර්ග්‍රහනය කරන ලද අතර එමගින් යන්ත්‍රෝපකරණ, රෝද 2 සහ රෝද 4 ට්‍රැක්ටර වැනි කෘෂිකාර්මික රථවාහන, ත්‍රි රෝද රථ, යතුරු පැදි සහ වෘත්තිකයින් වෙත මෝටර් රථද ලබාදීමට හැකි විය.

එමනිසා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මේ වන පරිපූර්ණ මූල්‍යමය සේවා සම්පාදකයකු වශයෙන් ස්ථානගතව ඇත්තේ නිවාස සඳහා අරමුදල් සම්පාදනය සමගින් පුළුල් පරාසයක පැතිරුනු සමගාමී සේවාවන් රැසක් සපයනු ලබන මූල්‍යමය ආයතනයක් වශයෙනි. මෙම නව ආකෘතිය හේතුවෙන් අප හට ග්‍රාමීය හා නාගරික ප්‍රජාවන්ගේ නිවාස අවශ්‍යතා සපුරාලීමෙන් ඔබ්බට යමින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව සහ පෞද්ගලික සංවර්ධන අවශ්‍යතා ඉටු කරමින් ජීවන තත්වය උසස් කිරීමේ අවස්ථාවද උදා වී ඇත. උදාහරණයක් වශයෙන් නිවස සමග කුඩා ව්‍යාපාරික ස්ථානයක් ඉදිකර ගැනීමේ අවස්ථාව ගනුදෙනුකරුවන් වෙත සලසන්නා වූ ව්‍යාපාර සංවර්ධන සංරචකයක් සහිත නිවාස ණය සඳහා හිමි වූ යහපත් ප්‍රතිචාරය දක්විය හැක. අධ්‍යාපනික ණය සේවාවන් හඳුන්වාදීමෙන් අනතුරුව ග්‍රාමීය හා නාගරික ප්‍රජාවන් වෙතින් ඒ සඳහා ප්‍රබල ඉල්ලුමක් දැක ගත හැකි විය. මෙවැනි බහු කාර්ය ණය සැලසුම් සඳහා වැඩි අවස්ථාවක් පවතින බවත් ඉදිරි වසර වලදී ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි සුවිශේෂී ව්‍යාපාරික ආකෘතිය ප්‍රබල වර්ධනයක් අත්කර ගනු ඇති බවත් මාගේ ඒකායන විශ්වාසයයි.

අපගේ මූල්‍යමය සැලසුම් පෙළ ව්‍යාප්තීකරණයත් සමග අප විසින් සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ට කළමනාකරුවකු කල්බදු සඳහා බඳවා ගන්නා ලද අතර කාර්ය මණ්ඩලය සඳහාද අංග සම්පූර්ණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මේ වන විට අපගේ කාර්ය මණ්ඩලය නව කල්බදු හා සුළු හා මධ්‍ය පරිමාණ ණය සහ ක්ෂුද්‍ර මූල්‍ය සැලසුම් සම්බන්ධ මනා පුහුණුවක් ලබා ඇති බවත් ඒකී නව අංශ, ක්ෂේත්‍ර විශේෂඥයින්ගේ කළමනාකරණය යටතේ පවතින බවත් ප්‍රකාශ කරනු කැමැත්තෙමි. එමනිසා අප මේ වන විට මෙම වෙළඳපළ තුළ ව්‍යාප්ත වීම සඳහා මනා සූදානමකින් පසුවන බවත් ඉදිරි මූල්‍ය වර්ෂයේදී සාර්ථක ප්‍රතිඵල දැකගත හැකි වනු ඇති බවත් මාගේ විශ්වාසයයි.

**"ඉහත සඳහන් කරන ලද මෙකී නව සැලසුම් කාණ්ඩයන් වනුයේ කල්බදු, ක්ෂුද්‍ර මූල්‍ය ණය, සුළු හා මධ්‍ය පරිමාණ ණය සහ අධ්‍යාපනික ණය සැලසුම් වේ. මෙම නව සැලසුම් පෙළ මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙනත් බැංකු සමග තරගකාරී තත්වයකට පත් කරන ලද අතර එමගින් වඩාත් නම්‍යශීලී සැලසුම් පෙළක් සහ වඩාත් පුළුල් මෙහෙයුම් කෂේත්‍රයක් නිර්මාණය කෙරිණි. අපගේ ක්ෂුද්‍ර මූල්‍ය සහ සුළු හා මධ්‍ය පරිමාණ ණය ධාරාවන් වසර ගණනාවක් තිස්සේ ග්‍රාමීය හා නාගරික ප්‍රජාව සමග කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ලද පරිචය මගින් බලාත්මක අයුරින් මෙහෙයවිය හැකි වූ අතර එමගින් අදාළ ප්‍රජාවන් වෙත පරිපූර්ණ වූ මූල්‍යමය සේවාවන් ලබාදීමේ හැකියාව අප වෙත හිමි විය."**

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ විමර්ශනය

"වසර 2012 දී ලද රුපියල් මිලියන 175.7 ට සාපේක්ෂව 2013 දී අපගේ බැංකුව රුපියල් මිලියන 309.2 ක බදු පෙර ලාභයක් වාර්තා කළේය. බදු වලට පසු ලාභය පසුගිය වසරේ වූ රුපියල් මිලියන 55.5 ට සාපේක්ෂව රුපියල් මිලියන 158 ක් වූ අතර එය දළ වශයෙන් 185% ක් වූ දැවැන්ත වර්ධනයකි"

සුළු පරිමාණයෙන් වුවද අප අඛණ්ඩවම රන් වෙළඳපළ තුළ ක්‍රියාත්මක වූ අතර රන් වෙළඳපළෙහි උද්ගත වූ හදිසි අවගමනය හමුවේ වුවද අපගේ රන් සැලසුම් පෙළ වෙත සිදුවූයේ අවම හානියක් බවද ප්‍රකාශයට පත් කරමි. කෙසේ වුවද වර්තමාන වෙළඳපළ තත්වය අනුව රන් වෙළඳපළ තුළ අපගේ ව්‍යාප්තිය පරීක්ෂාකාරී සහ දැඩි අධීක්ෂණයක් යටතේ සිදුවනු ඇත.

### ඉතිහාසගත ණයකර නිකුතුව

වසර 2013 දී කැපී පෙනෙන සිදුවීමක් වනුයේ රුපියල් බිලියන 2ක් ඒකරාශී කර ගත හැකි වූ අපගේ පළමු හා අති සාර්ථක ණයකර නිකුතුවයි. මේ සඳහා ආරම්භක දිනයේදීම රුපියල් බිලියන 4ක අධි දායකත්වයක් හිමි වූ අතර එමගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි උසස් සන්නාම අගය විදහා දැක්විණි. ණයකර නිකුතුව ඔස්සේ අපගේ අරමුණ වූයේ අපගේ වත්කම් සහ වගකීම් අන්තරය කළමනාකරණය සඳහා දිගු කාලීන අරමුදල් සම්පාදනය සහ ණය ලබාදීම සඳහා අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීමයි.

### අපගේ මූල්‍යමය කාර්යසාධනය

ව්‍යාප්තිය හා අභ්‍යන්තර ධාරිතා වර්ධනය සඳහා වූ අපගේ ආයෝජනයන් අපගේ මූල්‍යමය කාර්යසාධනය මගින් නිරූපනය වේ. වසර 2012 දී ලද රුපියල් මිලියන 175.7 ට සාපේක්ෂව 2013දී අපගේ බැංකුව රුපියල් මිලියන 309.2 ක බදු පෙර ලාභයක් වාර්තා කළේය. බදු වලට පසු ලාභය පසුගිය වසරේ වූ රුපියල් මිලියන 55.5ට සාපේක්ෂව රුපියල් මිලියන 158 ක් වූ අතර එය දළ වශයෙන් 185% ක දැවැන්ත වර්ධනයකි.

බැංකුවේ පොළී ආදායම 2012 පැවති රුපියල් මිලියන 2634 සිට රුපියල් මිලියන 3,528 දක්වා වර්ධනය වූ අතර එය 34% ක වර්ධනයකි. ශුද්ධ පොළී ආදායම රුපියල් මිලියන 829.4 සිට රුපියල් මිලියන 1,058 දක්වා 28%කින් වර්ධනය විය. බැංකුවේ ණය සැලසුම් පෙළ රුපියල් මිලයන 15.9 සිට රුපියල් මිලියන 19.7 දක්වා වර්ධනය වූ අතර එය 23.7%ක ඉහළ යාමකි. තැන්පතු පදනම පෙර වසරේ පැවති රුපියල් මිලියන 14.6% සිට රුපියල් මිලියන 18.9 දක්වා 28.7%කින් වර්ධනය විය.

විමර්ශනයට ලක් වන කාල පරිච්ඡේදය තුළ අපගේ වත්කම් මත ආදායම (ROA) පෙර වසරේ පැවති 0.27%ට සාපේක්ෂව 0.75% වශයෙන් පැවති අතර කොටස් මත ආදායම (ROE) 2.35% සිට 6.14% දක්වා වර්ධනය විය.

පහළ පොළී අනුපාත වටපිටාව හේතුවෙන් වසර තුළදී දිවයින පුරා නිවාස ණය සඳහා වූ ඉල්ලුමෙහි ප්‍රබල ඉහළ යාමක් දැකගත හැකි විය ඉල්ලුමෙහි ඇති වූ මෙම වර්ධනයත් සමග අපගේ නිවාස ණය සැලසුම් පෙළ වටිනාකම අනුව රුපියල් මිලියන 20,009 කරා ළඟා වූයේ 23%ක වර්ධනයක් වාර්තා කරමිනි.

වසර 2013දී ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියම කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාව අවශ්‍යතා සපුරා ගන්නා ලදි. 2013 දෙසැම්බර් 31 දිනට ස්ථර 1 සහ ස්ථර 2 ප්‍රාග්ධනය පිළිවෙළින් 5% සහ 10% නියාමන අවශ්‍යතාවයන්ට එරෙහිව 17.96% සහ 18.46 වශයෙන් පැවතිණි.

අප 2013දී ශීඝ්‍ර තැන්පතු වර්ධනයක් අත්විඳි අතර සමස්ත තැන්පතු පදනම වසර 2012 දී පැවති 5%ක වර්ධනයට සාපේක්ෂව 28.7%ක වර්ධනයක් වාර්තා කළේය. 2013 දෙසැම්බර් වන විට අපගේ තැන්පතු රුපියල් මිලියන 18,914ක් වශයෙන් පැවති අතර ඒවා රාජ්‍ය, ආයතනික හා පුද්ගල තැන්පතු වල මනා සංකලනයකින් සමන්විත විය. ස්ථාවර තැන්පතු 28.3%කින්ද ඉතුරුම් තැන්පතු 32%කින්ද වර්ධනය විය.

අපගේ ණය ලබාදීම් රුපියල් බිලියන 19.70 දක්වා 23.4%ක වර්ධනයක් වාර්තා කළ අතර වසර 2012දී වාර්තා වූ වර්ධනය 8%කි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ සම්ප්‍රදායික ණය සැලසුම් වල සිට වෙනත් ණය ලබාදීම් දක්වා සිදු කරන ලද විවිධාංගීකරණයන්ය. විශේෂයෙන් ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ක්ෂුද්‍ර මූල්‍ය සහ ව්‍යාපාරික ණය සඳහා දිරිගන්වන සුළු ඉල්ලීම් පිට පළාත් වලින් සිදුකෙරිණි. එය එම වෙළඳපළ වර්ධනය සඳහා වූ යහපත් ලක්ෂණයක් ලෙස මම සලකමි. අප විසින් අඛණ්ඩවම සේවක අර්ථසාධක අරමුදල මත ලබාදෙන ණය පවත්වා ගෙන යන ලද අතර එය ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි සමස්ත ණය සැලසුම් පෙළෙහි 40%කට ආසන්න ප්‍රතිශතයක් නියෝජනය කළේය.

උසස් තත්වයේ ණය තක්සේරුකරණ ක්‍රියාවලියක් ඔස්සේ හිතකර අත්තිකාරම් සේවා පෙළක් පවත්වා ගෙන යාමට අපි සමත් වීමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහ බැංකුව මගින් ආපසු ගෙවීම සහතික කෙරෙන සේවක අර්ථසාධක අරමුදල් කාණ්ඩය හැර 2013 දෙසැම්බර් අවසානය වන විට අපගේ ණය ආපසු නොගෙවීමේ ප්‍රතිශතය 7.26 ක් වූ අතර 2012දී එම අගය 7.96 ක් විය. මෙය නිවාස මූල්‍ය ක්ෂේත්‍රයේ සාමාන්‍යය වන 5.6% වඩා සුළු වශයෙන් ඉහළ අගයක් වුවද මේ සඳහා හේතුව වන්නේ විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශයන්හි අවදානම් සහගත කාණ්ඩයක් වන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි පහළ සහ මධ්‍යම ආදායම්ලාභී ප්‍රජාවන්ගේ ඉහළ අවදානම් ලක්ෂණයන්ය. කෙසේවුවද මාගේ අදහස වන්නේ අප පහල ආදායම් සහිත ප්‍රජාවන් වෙත සේවය කළ යුතු බවයි. එසේ වුවද ප්‍රජා සුභසාධනය හේතුවෙන් අපි අපගේ මූල්‍යමය තත්වයන් අනතුරෙහි හෙළීමට කිසිසේත්ම කටයුතු නොකරමු. ඒ වෙනුවට අපගේ ප්‍රයත්නය වනුයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් සමතුලිතව පවත්වා ගෙන යාම ඔස්සේ සියළුම පාර්ශවකරුවන් වෙත උපරිම ප්‍රතිලාභ ලබාදීමයි.

### තාක්ෂණය

තාක්ෂණික යෙදවුම් ඔස්සේ ලබාදෙන්නා වූ පිරිවැය පහත හෙළීම උදෙසා අපගේ තාක්ෂණික ක්‍රමවේදයන් නිරතුරුවම වැඩිදියුණු කෙරේ. වර්තමාන වසර තුළ අප විසින් නව වෙළඳපළ තත්වයන්ට මුහුණුදීම සඳහා වන නව බැංකුකරණ පරිඝණක පද්ධතියක් සම්බන්ධ යෝජනාවක් සම්මත කොට ඇති අතර එය 2014 වසරේදී ක්‍රියාවට නැවෙනු ඇත.

### රජයේ සංවර්ධන සැලසුම් සඳහා සහායදීම

රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් වෙත අපගේ සහයෝගය හිමි වන අතර වසර 2013දී ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මගින් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය සම එක්ව ජන සෙවන ව්‍යාපෘතිය යටතේ පහළ සහ මධ්‍යම ආදායම්ලාභීන් වෙත සහ රජයේ සේවකයින් වෙත නිවාස පහසුකම් ලබාදීමට කටයුතු කෙරිණි. මෙහිදී සහනදායී පොළී අනුපාත යටතේ එක් ගනුදෙනුකරුවකු හට රු. 500,000 ක් දක්වා ණය මුදල් පිරිනැමිණි. එවැනි තවත් ව්‍යාපෘතියක් වූයේ උතුරු නැගෙනහිර යුද්ධයෙන් හානියට පත් නිවාස ප්‍රතිසංස්කරණය සඳහා වූ මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය සම්පාදන වැඩනටහනට දායක වීමයි. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි යාපනය, වව්නියාව, ත්‍රිකුණාමළය සහ මඩකළපුව ශාඛාවන් මගින් සාර්ථකව මෙම ණය ප්‍රදානයන් සිදුකෙරිණි.

### අපගේ කාර්ය මණ්ඩලය

අපගේ සැලසුම් විවිධාංගිකරණ ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීමේදී වසර 2013 දී මානව සම්පත අතිශය වැදගත් සාධකයක් බවට පත් විය. අපගේ කාර්ය මණ්ඩලය එතෙක් හුරුව පැවතියේ නිවාස ණය ලබාදීම සඳහා පමණක් වූ බැවින් අප මුහුණ පෑ ප්‍රධාන අභියෝගය වූයේ ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාවයයි. එහිදී වසරේ මාස 12 සඳහා වූ පුහුණු දින දර්ශනයක් යොදා ගනිමින් නව භූමිකාවන් සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කෙරිණි. අපගේ මූල්‍යමය ප්‍රතිඵල මෙම පුහුණු වැඩසටහන් වල සාර්ථකත්වය පිලිඹිබු කරන අතර ඉදිරි වසර කිහිපය තුළදී මෙහි ප්‍රතිඵල තවදුරටත් දැකගත හැකි වනු ඇති බව මාගේ විශ්වාසයයි.

### සම්මාන සහ ඇගයුම්

වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මගින් සිදුකරන ලද ජනතා මෙහෙවර උදෙසා විවිධ ආයතනයහි ඇගයීම් අප වෙත හිමි විය. මෙම වසරේදීද අප වෙත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් වාර්ෂික වාර්තාව සඳහා වන ලෝකඩ සම්මානය පිරිනැමිණි. ACCA තිරසාරත්ව සම්මාන උළෙලේදී බැංකුකරණ මූල්‍ය සහ රක්ෂණ කාණ්ඩයේ අනුශූරතා සම්මානය හිමි විය. LMD සඟරාවෙහි Sting ආයතනික වගකීම් සහගත ශ්‍රේණිගත කිරීම් වලදී නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව රජත කාණ්ඩය යටතේ ශ්‍රේණිගත කෙරිණි. මෙම වසර තුළදී විශේෂ සම්මාන අංශයේ විශිෂ්ටතම වාර්ෂික වාර්තාව වෙනුවෙන් වූ ADFIAP සම්මානයද අප වෙත හිමි විය.

### අනාගත දැක්ම

### නව ක්‍රමෝපායික දර්ශනයක්

2013 මැයි මස අප විසින් 2014 සිට 2016 දක්වා තෙවසරක ක්‍රමෝපායික සැළසුමක් සැකසීම ඇරඹිණි. මාස 6ක කාලයක් තුළ මෙය සැකසුනු අතර ඒ සඳහා ආයතනික කළමනාකාරීත්වය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, ප්‍රාදේශීය සහ ශාඛා කළමනාකාරීත්වයේ ක්‍රියාකාරී දායකත්වය හිමි විය. මේ සඳහා මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර එය 2014 ජනවාරි මස ක්‍රියාවට නැංවෙනු ඇත. එමනිසා දැන් අප සතුව වර්ධනය ඉලක්ක කොට ගත් පරිපූර්ණ ක්‍රමෝපායි සැලසුමක් සහ ක්‍රියාකාරී සැලසුමක් පවතී.

මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වනුයේ බැංකුකරණ ක්ෂේත්‍රය ඒකාබද්ධ කිරීම සඳහා වන මහ බැංකුවේ ක්‍රමෝපායයි. ඒ අනුව ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවටද තවත් මූල්‍යායතනයක් සමග එක් වීමට සිදුවේ. මෙමගින් ඉදිරි වසර තුන තුළ අපගේ දැනට පවතින වත්කම්

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ විමර්ශනය

පදනම වන රුපියල් බිලියන 28 මහ බැංකුවේ ඉලක්කය වන රුපියල් බිලියන 100 දක්වා වර්ධනය කෙරෙනු ඇත. මේ හරහා විශාල වත්කම් පදනමක් මගින් වෙළඳපළ අවදානම් දරා ගැනීමේ හැකියාව වර්ධනය කරමින් වෙළඳපළ ඉල්ලුම සපුරාලිය හැකි තත්වයක් නිර්මාණය වනු ඇති බව මාගේ විශ්වාසයයි. මෙම ආයතනික සන්ධානගත වීම ඔස්සේ කිසිවිටකත් මධ්‍යම හා අඩු වරප්‍රසාද ප්‍රජාවන් වෙත සේවා සැළසීමේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි ව්‍යාපාර ආකෘතිය පරදුවට නොතැබෙන බවත් එය තවදුරටත් ශක්තිමත් වනු ඇති බවත් අවධාරනය කරනු කැමැත්තෙමි. එමෙන්ම මෙම ක්‍රියාවලියේදී ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි කාර්ය මණ්ඩලය රඳවා ගැනීම ප්‍රමුඛතාවක් බව ප්‍රකාශ කරමි. කෙසේ වුවද මෙම තොරා ගනුලැබූ හවුල්කරු සමඟ ඒකාබද්ධ වීමේදී නව ආයතනික ව්‍යුහයක අවශ්‍යතාවද මානව සහ වෙනත් සම්පත් ඒකාබද්ධ කිරීමේදී අභියෝග වලට මුහුණදීමටද සිදුවනු ඇත. එමනිසා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි සමස්ත කාර්ය මණ්ඩලය වෙතින් මා සිදුකරනු ලබන ඉල්ලීම වනුයේ මෙම ක්‍රියාදාමයට සහයෝගය දක්වමින් අප සැම සහ ගනුදෙනුකරුවන්, කොටස් හිමියන් ඇතුළු සියළු පාර්ශවයන් වෙත ප්‍රතිලාභ අත්වන අන්දමේ ප්‍රතිඵලයක් අත්කර ගැනීමට කැපවන ලෙසයි.

**ප්‍රණාමය**

සාර්ථක වසරක් අවසානයේ මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා ඇතුළු බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සහ කාර්ය මණ්ඩලය වෙත ඔවුන්ගේ වෘත්තිමය මඟ පෙන්වීම සඳහා දුන් දායකත්වයට මාගේ ප්‍රණාමය පුද කෙරේ. එමෙන්ම මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ නිලධාරීන්, ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශ නිලධාරීන් සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ කටයුතු කිරීමේදී ඔවුන් විසින් දක්වන ලද සහයෝගය මාගේ පැසසුමට ලක් වේ. තවද ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි සභාපතිනි සිරෝමි වික්‍රමසිංහ මැතිණිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරන්තර මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් මාගේ කෘතඥතාවය මෙසේ පළ කෙරේ. මෙම සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට බෙහෙවින් ඉවහල් වූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි කාර්ය මණ්ඩලය වෙත මාගේ හදපිරි ස්තුතිය මෙසේ පුද කෙරේ. අවසාන වශයෙන් අප හා රැඳුනු කොටස් හිමිකරුවන්, ගනුදෙනුකරුවන් සහ වෙනත් පාර්ශවකරුවන් වෙත සිය හිතෛෂීභාවය වෙනුවෙන් මාගේ අවංක ප්‍රණාමය හිමි වේ.



**නිමල් ජේ. බී. මාමඩුව**
ප්‍රවිනි/සාමාන්‍යාධිකාරී

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

### 1 පොදු

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ විගණිත මූල්‍යමය ප්‍රකාශන සහ විගණන වාර්තාව සමගින් වසර 2013 සඳහා වන වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරමු.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව1997 අංක 07 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පනත (සංශෝධිත 2003 අංක 15 දරණ පනත සහ 2011 අංක 45 දරණ පනත) මගින් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද මහජන ලැයිස්තුගත බලපත්‍රලත් විශේෂිත බැංකුවකි.

### 2 මූලික ක්‍රියාකාරකම්

නිවාස සහ නිවාස සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා මූල්‍ය සම්පාදනය අඛණ්ඩවම බැංකුවේ මූලික ක්‍රියාකාරකම් වශයෙන් පැවති අතර විමර්ශනයට ලක් වන කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූලික ක්‍රියාකාරකම් වල කැපී පෙනෙන වෙනසක් සිදුනොවීය.

### 3 ව්‍යාපාර විමර්ශනය

විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ මූල්‍යමය ස්ථානගතවීම කාර්යසාධනය ක්‍රියාකාරකම් වල තත්වය සහ කැපීපෙනෙන සිදුවීම් පිළිබඳ සමස්ත විග්‍රහයක් පිටු අංක 08 සිට 12 දක්වා සාමාන්‍යාධිකාරිවරයාගේ/ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ විමර්ශනයෙහි දැක්වෙන අතර වසරේ සුවිශේෂතා පිටු අංක 02 සිට 03 දක්වා ඇතුළත් වේ. මෙම වාර්තාවන් මගින් අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවෙහි වැදගත් පාර්ශවයක් නිර්මාණය වේ.

### 4 දර්ශනය, මෙහෙවර ප්‍රකාශය සහ ආයතනික චර්යාව

දර්ශනය සහ මෙහෙවර ප්‍රකාශය සෑම කල්හිම ආයතනික සැලසුමට අනුකූලව පැවති අතර බැංකුව මගින් හැමවිටම සිය දර්ශනය සහ මෙයෙවර ප්‍රකාශය යථාර්ථයක් බවට පත් කරගැනීමේදී ප්‍රශස්ත මට්ටමින් ආචාර ධර්ම සම්මතයන්ට අනුකූලව කටයුතු කරමින් මෙහෙයුම් සිදු කරන ලදී.

### 5 අනාගත වර්ධනයන්

බැංකුවේ අනාගත ක්‍රමෝපායන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 8 සිට 12 දක්වා සාමාන්‍යාධිකාරිවරයාගේ/ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ විමර්ශනයෙහි දක්වා ඇති පරිදි එහි සංස්ථාපිත පනත (සහ සංශෝධනයන්)ට අනුකූලව පවතී.

### 6 මූල්‍යමය ප්‍රකාශන

විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ නිසි පරිදි අත්සන් තබා සහතික කොට අනුමත කරන ලද මූල්‍යමය ප්‍රකාශනයන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 25 සිට 28 දක්වා ඉදිරිපත් කොට ඇත.

### 7 ප්‍රමුඛ ගිණුම් ගිණුම්කරණ ප්‍රමිතීන්

වසර තුළ මූල්‍යමය ප්‍රකාශනයන් සැකසීම සඳහා යොදාගන්නා ලද ප්‍රමුඛ ගිණුම්කරණ ප්‍රමිතීන් වාර්ෂික වාර්තාවේ පිටු අංක 30 සිට 33 දක්වා ඉදිරිපත් කොට ඇත. කොටස් වල වෙනස්වීමේ බලපෑම වාර්ෂික වාර්තාවේ පිටු අංක 29 හි දක්වා ඇත.

### 8 විගණකවරුන්ගේ වාර්තාව

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ විගණකවරයා වන ශ්‍රී ලංකාවේ විගණකාධිපතිතුමන් විසින් විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍යමය ප්‍රකාශනයන් සම්බන්ධ විගණනය සිදුකරනු ලැබ ඇති අතර විගණකවරුන්ගෙ වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 23 සහ 24හි දැක්වේ.

### 9 අඛණ්ඩ පැවැත්ම

අනාවැකි පළ කළ අනාගත කාලපරිච්ඡේදයක් තුළ අඛණ්ඩ පැවැත්ම සඳහා ප්‍රමාණවත් සම්පත් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ ඒ අනුව ව්‍යාපාරික මෙහෙයුම් අඛණ්ඩව සිදුකිරීමේ සංකල්පය අනුව මූල්‍යමය ප්‍රකාශනයන් සකසා ඇත.

### 10 ආදායම

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා බැංකුවේ ආදායම රුපියල් මිලියන 3,803ක් විය. ආදායම පිළිබඳ විමර්ශනයක් පිටු අංක 36 සහ 37 හි මූල්‍යමය ප්‍රකාශනයන් සඳහා සටහන් 01, 03 සහ 04හි දක්වා ඇත.

### 11 ලාභය සහ වෙන්කිරීම

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා බැංකුවේ ආදායම් බදු පෙර ලාභය රුපියල් මිලියන 231ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා බදු වලට පසු ලාභය රුපියල් මිලියන 158ක් විය.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි ලාභය පිළිබඳ විස්තර පහත දැක්වෙන වගුවෙහි ඉදිරිපත් කොට ඇත ඃ

| 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | රුපියල් මිලියන 2013 | රුපියල් මිලියන 2012 |
|---|---|---|
| එකතු කළ අගය මත බදු වලට පෙර සාමාන්‍ය ක්‍රියාකාරකම් මගින් මෙහෙයුම් ලාභය | 309 | 176 |
| මූල්‍යමය සේවාවන් සඳහා එකතු කළ අගය මත බදු | 78 | 50 |
| බදුකරණය සඳහා වෙන්කිරීම | 73 | 70 |
| බදු වලට පසු සාමාන්‍ය ක්‍රියාකාරකම් මත ලාභය | 158 | 56 |
| රඳවාගත් ලාභය/(ඒකරාශී වූ අලාභ) ඉදිරියට ගෙන ආ | 1192 | 1170 |
| වෙන්කිරීම සඳහා පවතින ලාභය | 1349 | 1226 |
| යෝජිත පළමු සහ අවසන් ලාභාංශ සඳහා වෙන්කිරීම | - | - |
| සංචිත අරමුදල් වෙත මාරුකිරීම | 81 | 34 |
| ඉදිරියට ගෙන ආ රඳවාගත් ලාභය | 1269 | 1192 |

### 12 සංචිත

2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු සංචිත වටිනාකම රුපියල් මිලියන 2,575ක් විය. කොටස් වල වෙනස්වීම් පිළිබඳ විස්තර මූල්‍යමය ප්‍රකාශනයන්හි පිටු අංක 29 හි දක්වා ඇත.

### 13 ප්‍රදානයන්

වසර තුළ බැංකුව මගින් රුපියල් 1,197,460/- ක වටිනාකමකින් යුතු ප්‍රදානයන් සිදුකොට ඇත.

### 14 ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය වෙනත් නියාමන ආයතනයන් සහ සේවකයින් සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිය දැනුම හා විශ්වාසය අනුව නිසි කලට ගෙවා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

### 15 බදුකරණය සඳහා වෙන්කිරීම

2013 සඳහා ආදායම් බදු බැංකුවේ මෙහෙයුම් වලින් ඉපැයුනු බදු අය කළ හැකි ආදායමින් 28%ක් වශයෙන් සපයනු ලැබ ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 39හි මූල්‍යමය ප්‍රකාශන සඳහා සටහන් අංක 9හි දක්වා ඇත.

### 16 ලාභාංශ

අධ්‍යක්ෂවරුන් විසින් වසර 2013 සඳහා කොටසකට ශත විසි පහක ලාභාංශ ගෙවීමක් (අවසාන) නිර්දේශ කරනු ලැබ ඇත.

වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජිත අවසන් ලාභාංශ ගෙවූ වහාම අංක 7 දරණ 2007 සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර බැංකුව නුබුන්වත්භාව පරීක්ෂණයෙහි අවශ්‍යතා සපුරාලනු ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නුබුන්වත්භාව ප්‍රකාශනයක් විගණකාධිපතිතුමන් වෙත භාරදීමෙන් අනතුරුව ව්‍යස්ථාපිත ගෙවීම වෙත තහවුරු කරමින් අවසන් ලාභාංශ ගෙවීම සම්බන්ධ සහතිකයක් හිමිකර ගත්තේය.

### 17 සින්නක්කර දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ

සින්නක්කර දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ මත ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 66ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පිටු අංක 43හි මූල්‍යමය ප්‍රකාශන සඳහා සටහන් අංක 16හි දක්වා ඇත. සින්නක්කර දේපළ සම්බන්ධ විස්තර පිටු අංක 43හි මූල්‍යමය ප්‍රකාශන සඳහා සටහන් අංක 16හි දක්වා ඇත.

### 18 සින්නක්කර දේපළ වෙළඳපළ වටිනාකම

සින්නක්කර දේපළ වල වෙළඳපළ වටිනාකම පිටු අංක 43 සහ 45හි මූල්‍යමය ප්‍රකාශන සඳහා සටහන් අංක 16 සහ 17හි දක්වා ඇත.

### 19 මූල්‍යමය තත්වය ප්‍රකාශිත දිනයට පසු සිදුවීම්

මූල්‍යමය ප්‍රකාශනයන්හි සැකසුම් හෝ අනාවරණයන් අවශ්‍ය වන කිසිදු භෞතික සිදුවීමක් මූල්‍යමය තත්වය ප්‍රකාශිත දිනට පසු සිදු නොවීය.

### 20 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 962ක් වූ අතර එය සාමාන්‍ය කොටස් 64,710,520 කින් සමන්විත විය.

### 21 කොටස් පිළිබඳ විස්තර

කොටස් ආශ්‍රිත විස්තර (ඉපැයීම් ලාභාංශ, ශුද්ධ වත්කම් සහ කොටසක වෙළඳපළ වටිනාකම) මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 54 සිට 56 දක්වා ඉදිරිපත් කොට ඇත.

සියළුම කොටස් හිමිකරුවන් ඔවුන් වෙත නිකුත් කරන ලද ආරම්භක කොන්දේසි වලට අනුකූලව සමානාත්මතාවයෙන් යුතුව සැළකිල්ලට ගෙන ඇත.

## 22 ලැයිස්තුගත සුරක්ෂිත ආපසු ලබාගත හැකි ණයකර නිකුතුව

2013 දෙසැම්බර් 31 දිනට බැංකුව රුපියල් මිලියන 2000ක මූර්ත වටිනාකමකින් යුත් ලැයිස්තුගත සුරක්ෂිත ආපසු ලබාගත හැකි ණයකර නිකුත් කොට ඇත. මෙම ණයකර නිකුතුවෙන් ලැබුනු ආදායම කල්පිරීමේ හිඟයන් පියවීම සහ බැංකුවේ මූල්‍යමය තත්වය සවිමත් කිරීම සඳහා භාවිත කෙරිණි. බැංකුව මගින් මෙම ණයකර කොළඹ කොටස් වෙළඳපළෙහි ප්‍රධාන පුවරුවෙහි ලැයිස්තුගත කොට ඇත. මූල්‍යමය තත්වය ප්‍රකාශයට පත්කිරීමේ දිනට පසු ගෙවිය යුතු ලාභාංශ පිළිබඳ විස්තර පිටු අංක 47හි මූල්‍යමය ප්‍රකාශනයන්හි සටහන් අංක 22හි ඉදිරිපත් කොට ඇත.

## 23 සියළුම පාර්ශවකරුවන් සමානාත්මතාවයෙන් යුතුව සැළකිල්ලට ගැනීම

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි ප්‍රගතිය කෙරෙහි සියළුම පාර්ශවකරුවන්ගේ දායකත්වය අගයමින් බැංකුව මගින් සියළුම කොටස් හිමිකරුවන් වෙත සමානාත්මතාවයෙන් යුතුව සැළකීම සඳහා සියළු විධිවිධාන යොදන ලදී.

## 24 අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සුදුසුකම් ලත් පරිණත වෘත්තිකයන්ගෙන් සමන්විත වේ. බැංකුව වෙත නායකත්වය සැපයීම සඳහා අවශ්‍ය නිපුණත්වය සහ පළපුරුද්ද ඔවුන් සතු වේ.

විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ බැංකුවෙහි අධ්‍යක්ෂකවරුන් පහත දැක්වෙන පරිදි වේ.

01 එස්. එන්. වික්‍රමසිංහ මහත්මිය (සභාපතිනී) 2013 මැයි මස යළි තේරීපත් විය - විධායක නොවන/ස්වාධීන

02 ඩබ්. ජේ. එල්.යූ. විජයවීර 2010 ජූනි මස යළි තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන

03 සී. විජයවර්ධන මහත්මිය 2013 ජූනි මස යළි තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන

04 එස්. ඒ. ජේ. සමරජීව 2013 ජූනි මස යළි තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන නොවන

05 ඩබ්. ඩී. ආර්. ඩී. ගුණරත්න 2013 ජූනි මස යළි තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන නොවන

06 ඒ. ජේ. ඇලෝසියස් 2011 මැයි මස තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන නොවන

07 එල්. ඊ. සුසන්ත සිල්වා 2012 මැයි මස තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන

08 ජී. එල්. එස්. සේනාධීර 2013 ජනවාරි මස තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන

09 ප්‍රසාද් ගල්හේන 2013 ජූනි මස තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන

10 එම්. සුරේන්ද්‍රන් 2013 ජූනි මස තේරීපත් විය - විධායක නොවන/ ස්වාධීන නොවන

විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි අධ්‍යක්ෂකවරුන්ගේ ඉල්ලා අස්වීම් පහත දැක්වෙන පරිදි වේ.

01 ඒ. ජේ. ඇලෝසියස් 2013 අප්‍රියෙල් සිට බලපැවැත්වෙන පරිදි

විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි අධ්‍යක්ෂකවරුන්ගේ ඉල්ලා අස්වීම් පහත දැක්වෙන පරිදි වේ.

01 ජී. එල්. එස්. සේනාධීර 08/01/2013 සිට බලපැවැත්වෙන පරිදි

02 ප්‍රසාද් ගල්හේන 31/06/ 2013 සිට බලපැවැත්වෙන පරිදි

03 එම්. සුරේන්ද්‍රන් 31/06/ 2013 සිට බලපැවැත්වෙන පරිදි

## 25 අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පාලන නියමයන්ට අනුකූලව අදාළ කාලපරිච්ඡේදය තුළ උප කමිටු හතරක් (විගණන, මානව සම්පත් සහ වේතන, නාම යෝජනා සහ ඒකාබද්ධ ආවදනාම් කළමනාකරණය) ක්‍රියාත්මක වූ අතර එම කමිටුවල අදාළ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 18 සිට 21 දක්වා ඉදිරිපත් කොට ඇත.

## 26 අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 14 ක් පැවතිණි.

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු රැස්වීම් පිළිබඳ විස්තර වෙන් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වාර්තාවන් තුළ මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 18 සිට 21 දක්වා ඉදිරිපත් කොට ඇත.

## 27 මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි කටයුතු වල තත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් නිරූපනය වන පරිදි බැංකුවෙහි මූල්‍යමය ප්‍රකාශන සැකසීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 22හි දැක්වේ.

## 28 පොළී සටහන් රෙජිස්ටරයෙහි ඇතුළත් කිරීම්

සමාගම් පනතට අනුගත වෙමින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මගින් පොළී සටහන් රෙජිස්ටරයක් පවත්වා ගෙන යනු ලබයි. අදාළ අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍යතාවය අනුව ප්‍රකාශයන් සිදුකොට ඇති අතර විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ පොළී සටහන් රෙජිස්ටරයෙහි ආශ්‍රිත ඇතුළත් කිරීම් සිදු කෙරිණි.

## 29 කොටස් හිමිකාරීත්වය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ අවධානය

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වයන් පහත දැක්වෙන පරිදි වේඃ

| | 31/12/2013 | 01/01/2013 |
|---|---|---|
| එස් එන් වික්‍රමසිංහ මහත්මිය (සභාපතිනී) | නැත | නැත |
| ඩබ් ජේ එල් යූ විජයවීර | 3000 | 3000 |
| සී විජයවර්ධන මහත්මිය | නැත | නැත |
| එස් ඒ ජී සමරජීව | නැත | නැත |
| ඩබ් ඩී ආර් ඩී ගුණරත්න | නැත | නැත |
| එල් ඊ සුසන්ත සිල්වා | 1000 | 1000 |
| ජී එල් එස් සේනාධීර | නැත | නැත |
| ප්‍රසාද් ගල්හේන | 1000 | නැත |
| එම් සුරේන්ද්‍රන් | නැත | නැත |

## 30 ගිවිසුම් සහ යෝජිත ගිවිසුම් සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් එළඹෙන ලද කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් කිසිදු ඍජු හෝ වක්‍ර වගකීමක් අධ්‍යකෂකවරුන් විසින් දරනු නොලැබේ. වැඩිදුර විස්තර මෙම වාර්තාවේ පිටු අංක 51හි ඉදිරිපත් කෙරේ.

ඔවුන් විසින් වගකීම් දරනු ලබන කරුණු ආශ්‍රිත ඡන්ද පළ කිරීමෙන් වළකින බවට තහවුරු කරනු පිණිස අධ්‍යක්ෂකවරුන් විසින් සිය වගකීම් (ඇත්නම්) අනාවරණය කරන ලදී.

## 31 ණයකර සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගල ණයකර හිමිකාරීත්වය පහත දැක්වෙන පරිදි වේඃ

| 2013 දෙසැම්බර් 31 දිනට | ණයකර | වටිනාකම |
|---|---|---|
| එස් එන් වික්‍රමසිංහ මහත්මිය (සභාපතිනී)* | 20.000 | 2.000.000 |
| ඩබ් ජේ එල් යූ විජයවීර | නැත | නැත |
| සී විජයවර්ධන මහත්මිය | නැත | නැත |
| එස් ඒ ජී සමරජීව | නැත | නැත |
| ඩබ් ඩී ආර් ඩී ගුණරත්න | නැත | නැත |
| එල් ඊ සුසන්ත සිල්වා | නැත | නැත |
| ජී එල් එස් සේනාධීර | නැත | නැත |
| ප්‍රසාද් ගල්හේන | නැත | නැත |
| එම් සුරේන්ද්‍රන් | නැත | නැත |
| එකතුව | 20.000 | 2.000.000 |

* සභාපතිනිය ණයකර 20,000ක සංඛ්‍යාවක් සඳහා දායකත්වය දැක්වූවාය. (වසර 5 - වරණය 3 වාර්ෂිකව ගෙවනු ලබන 15.50%ක ස්ථාවර පොළී අනුපාතය (වාර්ෂික ඉපැයුම් අනුපාතය 15.50%)

## 32 සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු

සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු වාර්ෂික වාර්තාවේ මූල්‍යමය ප්‍රකාශනයන්හි පිටු අංක 51හි සටහන 30හි දක්වා ඇත.

## 33 අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික පිටු අංක 38හි මූල්‍යමය ප්‍රකාශන සඳහා සටහන් අංක 07හි දැක්වේ.

## 34 සේවක කොටස් වරණ සැලසුම

සේවක කොටස් හිමිකාරීත්ව සැලසුම යටතේ මේ වන විටත් භාරකරු (ලෙගාලින්ක් ට්‍රස්ටී සර්විසස් පුද්ගලික සමාගම) වෙත නිකුත් කරනු ලැබ ඇති 3,485,520 මුළු කොටස් සංඛ්‍යාව 2014 අප්‍රියෙල් සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිලාභීන් වෙත මාරු කෙරෙන අතර එය 2016 දෙසැම්බර් මස අවසානයට පෙර සම්පූර්ණ කෙරේ. ඉහත දක්වන ලද කොටස් භාරය බැංකුව මගින් මූලික කොටස් නිකුතුව සිදුකරන ලද අවස්ථාවේ ඡන්ද බලය හිමි සාමාන්‍ය කොටස් වලින් 5%ක් අත්පත් කරගනිමින් සකසන ලදී.

### 35 පාරිසරික සංරක්ෂණය

පරිසරයට අහිතකර ලෙස බලපාන කිසිදු ක්‍රියාකාකරකමක බැංකුව නිරත වී නොමැති බවටත් අදාළ පාරිසරික රෙගුලාසි ප්‍රකාර කටයුතු කොට ඇති බවටත් සිය දැනුම හා විශ්වාසය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වෙයි.

### 36 අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිතිපතා බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය විමර්ශනයට ලක් කරන අතරතුර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි අවදානමට ලක් වීමේ අවස්ථාවන් හඳුනාගෙන තක්සේරු කොට කළමනාකරණය කරයි. මෙම කමිටු යුගලයම අවශ්‍ය නිර්දේශ සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරමින් පරිපූර්ණ අභ්‍යන්තර පාලන සහ අවදානම් පාලන ආකෘතියක් බැංකුව සතු වන බවට තහවුරු කරමින් එහි මෙහෙයුම් නිසි පරිදි සිදුකිරීමට එමගින් හැකිවන බවටද සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පිළිබඳ වැඩිදුර විස්තර පිටු අංක 18 හි විගණන කමිටු වාර්තාවේද පිටු අංක 21හි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වාර්තාවේද ඇතුළත් වේ.

### 37 අදාළ නීතිරීති හා රෙගුලාසි කෙරෙහි අනුගතවීම

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම පරිදි බැංකුව විසින් අනාවරණය කළ යුතු කිසිදු නෛතික කරුණක් සම්බන්ධයෙන් සෘජු හෝ වක්‍ර නීති හෝ රෙගුලාසි උල්ලංඝනය වීමක් සිදුනොවී ඇති අතර භෞතික මූල්‍යමය බලපෑමක් ඇති කළ හැකි අන්දමේ සේවක කළමනාකරණ අක්‍රමිකතා කිසිවක් සිදුවී නොමැත.

### 38 විගණකවරුන් පත් කිරීම

1997 අංක 07 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතින් ව්‍යවස්ථාපිත පරිදි බැංකුවේ විගණකවරයා වශයෙන් විගණකාධිපතිවරයා අඛණ්ඩව කටයුතු කරනු ඇත.

### 39 විගණකවරුන්ගේ පාරිශ්‍රමික සහ බැංකුවේ ගිවිසුම් කෙරෙහි අවධානය

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවස් වූ වසර සඳහා විගණකවරුනගේ ගාස්තු වශයෙන් බැංකුව මගින් විගණකවරුන් වෙත රු.864,727/-ක මුදලක් ගෙවන ලදී. බැංකුව සමග වෙනත් කිසිදු සම්බන්ධයක් හෝ වගකීමක් විගණකවරුන් සතු නොවේ.

### 40 විගණන කමිටුව

විගණන කමිටුවෙහි සංයුතිය සහ ඔවුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 18හි දක්වේ.

### 41 මහා සභා රැස්වීම සඳහා නිවේදනය

බැංකුවෙහි 29වැනි මහා සභා රැස්වීම 2014 මැයි මස 30 වැන දින පෙව 10.00ට කොළඹ 10, හෙජස් කෝට්, ඩීන්ස් පාර හරහා, අංක 10, පළමු මහළ, බුකර් රෙක්‍රියේෂන් පුද්ගලික සමාගම (ගාර්ඩිනියා ශාලාව) හිදී පැවැත්වේ.

මහා සභා රැස්වීම සඳහා නිවේදනය වාර්ෂික වාර්තාවේ පිටු අංක 59 හි දක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකට අනුව අත්සන් කළේ,

**සිරෝමි වික්‍රමසිංහ මහත්මිය**
සභාපතිනී

**කේ ටී ඩී ඩී ද සිල්වා මහත්මිය**
සමාගම් ලේකම්

# විගණන කමිටු වාර්තාව

කොටස් හුවමාරු කොමිසමෙහි නියමයන් සහ ආයතනික පාලනය සම්බන්ධ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන්හි අවශ්‍යතාවයන්ට අනුකූලව විගණන කමිටුව මගින් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සිය වාර්තාව ඉදිරිපත් කරනු ලබයි. විගණන කමිටුව පත් කරනු ලැබ ඇත්තේ අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට අනුකූලවය.

## විගණන කමිටුවෙහි කාර්යභාරය

විගණන කමිටුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ වත්කම් සුරක්ෂිතතාව, ගිණුම්කරණ පද්ධති සහ ක්‍රියාකාරකම්, අභ්‍යන්තර මූල්‍යමය පාලන ක්‍රියාවලීන්ගේ වගකීම් සහගතභාවය සහ සියළුම නෛතික අවශ්‍යතා සහ ගිණුම්කරණ සම්මතයන්ට අනුකූලව නිවැරදි මූල්‍යමය වාර්තාකරණය සහ ප්‍රකාශන සැකසීම ආශ්‍රිත සිය කාර්භාරයන් ඉටුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වීමයි.

## සාමාජිකත්වය සහ සහභාගීත්වය

විගණන කමිටුව සාමාජිකයින් හය දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් සියළු දෙනා විධායන නොවන අධ්‍යක්ෂවරුන් වෙති.

සාමාජිකයින්ගේ නම් සහ රැස්වීම් වලට සහභාගීවීම් වාර්ෂික වාර්තාවේ ආයතනික පාලන කාණ්ඩයෙහි දක්වේ.

## විගණන ගම්ටුවෙහි ක්‍රියාකාරීත්වය

විගණන කමිටුව මගින් විගණන කමිටු ප්‍රඥප්තිය අනුමත කොට ප්‍රඥප්තිය අනුව පහත දක්වෙන ක්‍රියාකාරකම් සපුරා ඇත.

* බාහිර විගණන වාර්තා විමර්ශනය.

* අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් වල කාර්යභාරය ස්වාධීනත්වය සහ බලාත්මකභාවය තක්සේරු කිරීම.

* අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සහ අභ්‍යන්තර විගණන සැලසුම අනුමත කිරීම.

* බැංකුව මගින් යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් සම්බන්ධ සියළුම යෝජිත වෙනස්කම්ඃ

* මූල්‍යමය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ සම්මතයන් සමාගම් පනත සහ කොළඹ කොටස් වෙළඳපළෙහි ලැයිස්තුගතවීමේ අවශ්‍යතාවන්ට අනුකූලව සකසා ඇති බව තහවුරු කරනු පිණිස කාර්තුමය සහ වාර්ෂික මූල්‍යමය ප්‍රකාශනයන් විමර්ශනය.

* බැංකුවෙහි අනුකූලතා සැලසුම විමර්ශනය සහ නියාමන අවදානම් හඳුනාගැනීම උදෙසා ක්‍රියාපටිපාටීන් තක්සේරුකරණය.

## විගණකවරුන්ගේ සහ විධායක කළමනාකාරීත්වයේ සහභාගීත්වය

අභ්‍යන්තර සහ බාහිර විගණකවරුන් විගණන කමිටුවෙහි සියළුම රැස්වීම් වලට සහභාගී වී වාර්තා කළහ. විධායක කළමනාකාරීත්වයද ඇරයුම මත රැස්වීම් වලට සහභාගී විය.

## අභ්‍යන්තර මූල්‍යමය පාලන ගිණුම්කරණ ක්‍රියාකාරකම් සහ බැංකු වාර්ෂික මූල්‍යමය ප්‍රකාශන

බැංකුවෙහි රක්ෂණ සම්පාදකයින්ගේ කාර්යභාරය මත පදනම්ව සියළුම භෞතික සාධක සම්බන්ධයෙන් බැංකුවෙහි අභ්‍යන්තර මූල්‍යමය පාලන පද්ධතිය සහ ගිණුම්කරණ ක්‍රියාකාරකම් විශ්වසනීය වාර්ෂික මූල්‍යමය ප්‍රකාශනයන් සඳහා පදනම නොසකසන බවට දක්වෙන කිසිදු කරුණක් කමිටුවෙහි අවධානයට පාත්‍ර නොවීය.

සියළුම භෞතික සාධක සම්බන්ධයෙන් බැංකුවෙහි වාර්ෂික මූල්‍යමය ප්‍රකාශන සමාගම් පනත සහ ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ සම්මතයන්ට අනුකූල බවට කමිටුව සෑහීමකට පත් වන අතර අදාළ මූල්‍යමය ප්‍රකාශනයන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා එමගින් නිර්දේශ කෙරේ.



**එල් ඊ එස් ද සිල්වා**
සභාපති ඃ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
4 අප්‍රියෙල් 2014

# අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටු වාර්තාව

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මානව සම්පත යනු සමාගමක වැදගත්ම ක්‍රමෝපායික වත්කම බවට විශ්වාසය පළ කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් උප කමිටුව සමාගමෙහි ප්‍රශස්ත මානව සම්පත් ක්‍රියාකරකම් සඳහා පිටුබලය සපයයි. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ සමාගම් ප්‍රතිපත්ති සේවක ප්‍රතිලාභ සහ පාලන යාන්ත්‍රණයන්  බැංකුවේ සේවක පිරිස රඳවා ගැනීම සඳහා ආධාර වේ.

විමර්ශනයට ලක් වන කාල පරිච්ඡේදය තුළ කමිටු සාමාජිකයින් වූයේ එස් එන් වික්‍රමසිංහ මිය (කමිටු සභාපතිනී  - විධායක නොවන අධ්‍යක්ෂිකා),ඩබ් ජේ එල් යූ විජයවීර(විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ), ( ජී එල් එස් සේනාධීර (විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ), ඩබ් ඩී ආර් ඩී ගුණරත්න (විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ) සහ එම් සුරේන්ද්‍රන් (2013 සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි.)

මෙම කමිටුව සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකියන අතර පහත දැක්වෙන ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා පත් කෙරිණි.

(අ) ප්‍රධාන විධායක ඇතුළු බැංකුවේ වෙනත් ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයන්ට අදාළ වැටුප් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

(ආ) ප්‍රධාන විධායක ඇතුළු බැංකුවේ වෙනත් ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයන් සඳහා ඉලක්ක නිර්මාණය කිරීම.

(ඇ) සකසන ලද ඉලක්ක සමග ප්‍රධාන විධායක ඇතුළු බැංකුවේ වෙනත් ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයන්ගේ කාර්යසාධනය ආවර්තිතව තක්සේරුගත කිරීම.

(ඈ) වැටුප් සංශෝධන, පූර්ව අවශ්‍යතා බඳවාගැනීම්, උසස්වීම්, නිලයන් වෙනස් කිරීම්, තනතුරු නිර්මාණය කිරීම්, ස්ථානගත කිරීම් සහ පුහුණු සැසි ආදිය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබාදීම.

අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය මෙම වාර්ෂික වාර්තාවේ අවසානයේ දැක්වේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී රැස්වීම් වලට පැමිණෙනුයේ ඇරයුම් මතය. කමිටුවට අවශ්‍ය අවස්ථාවන්හිදී ආයතනික කළමනාකාරීත්ව සාමාජිකයින් වෙත සහභාගී වීම සඳහා ඇරයුම් කෙරිණි.



**සිරෝමි වික්‍රමසිංහ මිය**
සභාපතිනී



**දර්ශනී ද සිල්වා මිය**
සමාගම් ලේකම්

# නාමයෝජනා කමිටුව

නාමයෝජනා කමිටුව අධ්‍යක්ෂකවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ පත් වීම් සහ පත්වීම් නැවත අළුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දක්වයි. මෙම කමිටුව එස් එන් වික්‍රමසිංහ මිය (කමිටු සභාපතිනී විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂිකා), ඩබ් ජේ එල් යූ විජයවීර (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂක), සී විජයවර්ධන මිය (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂිකා) යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විතය.

කමිටුව බැංකුවේ පහත දැක්වෙන අරමුණු ඉටු කර ගත හැකි අයුරින් කටයුතු කරයි ඃ

අ) ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත අනුව අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ පත් වීම් සිදුකිරීම සහ ඒ සඳහා තෝරාගැනීම.

ආ) සමස්ත අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ දායකත්වය සැළකිල්ලට ගැනීමේදී අධ්‍යක්ෂකවරුන් නැවත පත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඇ) පත්කිරීම ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් උසස් කිරීම සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු වලට පත් කිරීමේදී සුදුසුකම් සහ පළපුරුද්ද වැනි ප්‍රධාන සාධක සඳහා වන ක්‍රියාපටිපාටිය නිර්වචනය කිරීම.

ඈ) අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීවරයා සහ ප්‍රධාන කළමනාකාරීත්වය මහ බැංකුවේ සහ වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව මෙම තනතුරු හෙබවීම සඳහා යෝග්‍ය පුද්ගලයින් බවට තහවුරු කිරීම.

ඉ) විශ්‍රාම ලබන අධ්‍යක්ෂකවරුන් සහ ප්‍රධාන කළමනාකාරීත්වය සඳහා අනුප්‍රාප්තිකයින් පත්කිරීමේදී අවශ්‍ය නව විශේෂඥභාවයන් පිළිබඳ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

**සිරෝමි වික්‍රමසිංහ මිය**
සභාපතිනී

**දර්ශනී ද සිල්වා**
සමාගම් ලේකම්

# ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් නිරන්තර පදනමක් මත බැංකුවේ අවදානම් කළමනාකරණ කටයුතු සිදු කෙරේ. මෙය සිදුකෙරෙනුයේ අවදානම් කාර්ය කමිටුව සහ අවදානම් නිලධාරීවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අවදානම් දෙපාර්තමේන්තුව ඔස්සේ බැංකුව මගින් සකසනු ලැබ ඇති අවදානම් ආකෘතික රාමුවට අමතරවය. එස් එන් වික්‍රමසිංහ මහත්මිය ( කමිටු සභාපතිනී - විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂිකා), එල් ඊ සුසන්ත සිල්වා (විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ), ජී එල් එස් සේනාධීර (විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ), සී විජයවර්ධන මිය (විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂිකා) සහ ප්‍රසාද් ගල්හේන (විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ) යන මහත්වරුන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වශයෙන් සහභාගී වෙති. නිමල් ජේ. බී. මාමඩුව (සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී), එස් දිසානායක (ප්‍රධාන මෙහෙයුම් නිලධාරී), ඩී වී පතිරණ (ප්‍රධාන මූල්‍ය නිලධාරී) ,ඒ ජේ අතුකෝරළ (ප්‍රධාන අභ්‍යන්තර විගණක), ඩී එම් ඩී එම් කේ දිසානායක (ප්‍රධාන කළමනාකරු - ණය), බාලසූරිය (ප්‍රධාන කළමනාකරු භාණ්ඩාගාර), කේ ආර් එම් කේ බණ්ඩාර (අනුකූලතා නිලධාරී) සහ අයි නිශාන්ත (අවදානම් නිලධාරී) යන මහත්වරුන් විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ කමිටු සාමාජිකයින් වශයෙන් කටයුතු කළහ

ඉහත කමිටුව වෙත පත්වීම් සිදුකරන ලද්දේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි කමිටුව මගින් විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ රැස්වීම් 3ක් පවත්වන ලදී.

කමිටුව බැංකුවේ පහත දැක්වෙන ප්‍රධාන අරමුණු ඉටුවන අයුරින් කටයුතු කරයි.

අ) ණය වෙළඳපල ද්‍රවශීලතාවය සුදුසු අවදානම් දර්ශකයන් ඔස්සේ මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම සහ ලද කළමනාකරණ තොරතුරු තක්සේරුකරණය.

ආ) සියළුම කළමනාකාරීත්ව මට්ටමේ කමිටු වල ප්‍රමාණාත්මකභාවය සහ බලාත්මකභාවය විමර්ශනය කිරීම.

ඇ) බැංකු ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව මගින් තීරණය කරන ලද විචක්ෂණ මට්ටම ඉක්මවූ මට්ටම් වල පවතින විශේෂිත අවදානම් සම්බන්ධ නිසි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.

ඈ) කමිටුව විසින් නියම කරන ලද අයුරින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද අයුරින් විශේෂිත අවදානම් හඳුනාගනිමින් අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නොගත් නිලධාරීන්ට එරෙහිව නිසි ක්‍රියාමාර්ග ගැනීම.

ඉ) අනුකූලතා නිලධාරයකු පත් කරමින් සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍රයන් කෙරෙහි බැංකුවේ අනුගත වීම තහවුරු කිරීම සඳහා අනුගත වීම් ක්‍රියාකාරකමක් ස්ථාපනය කිරීම.

බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වා දෙන ලද පරිදි බැංකුවේ අවදානම් කළමනාකරණයෙහි ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධාන වලට කිසිදු අනුගත නොවීමක් හෝ නියාමන හෝ අධීක්ෂණ දෝෂයක් නොපවතින බවට කමිටුව තහවුරු කරන අතර මූල්‍ය මණ්ඩලය විසින් අදාළ ගැටළු නිරාකරණය සඳහා බැංකුව විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් සමගින් මෙය මහජනතාව වෙත අනාවරණය කළ යුතු වේ.

**සිරෝමි වික්‍රමසිංහ මිය**
සභාපතිනී

**දර්ශනී ද සිල්වා මිය**
සමාගම් ලේකම්

# මූල්‍යමය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍යමය වාර්තා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පහත දැක්වෙන ප්‍රකාශයෙහි සඳහන් පරිදි 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුකූලව සිදු කොට ඇත මූල්‍යමය ප්‍රකාශන සම්බන්ධ බාහිර විගණකවරුන්ගේ වගකීම විගණකවරුන්ගේ වාර්තාවේ ඇතුළත් වන අතර එය වාර්ෂික වාර්තාවේ පිටු අංක 23 සහ 24හි දැක්වේ.

2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුව අධ්‍යක්ෂවරුන් විසින් එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍යමය ප්‍රකාශන සකසා මහා සභා රැස්වීමක් වෙත ඉදිරිපත් කළ යුතු වේ. මෙම මූල්‍යමය ප්‍රකාශනයන් 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ වලින් සමන්විත විය යුතු වේ.

බැංකුවේ මූල්‍යමය ප්‍රකාශන මගින් ශේෂ පත්‍ර දින වනවිට සහ ශේෂ පත්‍ර දින අවසන් වූ වසර සඳහා බැංකුවේ ලාභ අලාභ සම්බන්ධව ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ කටයුතු වල තත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබාදෙයි.

මෙම මූල්‍යමය ප්‍රකාශන සැකසීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගනිමින් ඒවා අඛණ්ඩව යොදා ගනිමින් භෞතික ඉවත්වීම් ඇත්නම් අනාවරණය කරමින් සාධාරණ ඇස්තමේන්තු සකසමින් අදාළ සියළු ගිණුම්කරණ සම්මතයන් අනුගමනය කළ යුතු වේ.

එමෙන්ම මෙම මූල්‍යමය ප්‍රකාශන සැකසීමේදී ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියා (Going Concern) පදනම යොදා ගනිමින් සිය මෙහෙයුම් පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් බැංකුව සතු වන බවට අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කළ යුතු වේ.

වාර්තාවේ සකසා ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්(LKAS)/, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ සම්මතයන් (SLFRS), 2007 අංක 7 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන සම්මත පනත, 1988 අංක 30 දරණ බැංකුකරණ පනත සහ සංශෝධනයන්ට අනුකූල විය යුතු අතර කොළඹ කොටස් වෙළඳපළ නීතිරීති වලටද අනුකූල විය යුතු වේ.

බලාත්මක සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන්ද අධ්‍යක්ෂවරුන් වගකිව යුතු වේ. මෙය අභ්‍යන්තර පරීක්ෂාවන් අභ්‍යන්තර විගණන වලින් සමන්විත වන අතර සියළු මූල්‍ය හා වෙනත් පාලනයන් මගින් බැංකුකරණ ව්‍යාපාරය නිසි පරිදි එහි වත්කම් සුරකිමින් අක්‍රමිකතා වළකමින් වාර්තාවන්හි නිවැරදිභාවය සහ විශ්වසනීයත්වය හැකි උපරිමයෙන් පවත්වා ගත යුතු වේ.

අධ්‍යක්ෂවරුන් විසින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ බාහිර විගණකවරුන් වෙත ලබාදීම සඳහා මූල්‍යමය ප්‍රකාශන සැකසිය යුතු වන අතර අදාළ ප්‍රකාශන සම්බන්ධයෙන් ඔවුන්ගේ ස්වාධීන මතය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනය සම්බන්ධ නියැදි පරීක්ෂාවන් ආදිය සඳහා උපරිම අවස්ථාව ලබා දිය යුතු වේ.

ශේෂපත්‍ර දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් සියළුම ව්‍යවස්ථාපිත සහ නියාමන අධිකාරීන් වෙත ගෙවිය යුතු ගෙවීම් සිදුකොට ඇති බවට අධ්‍යක්ෂවරුන් සිය දැනුම අනුව සෑහීමකට පත් වේ.

මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි සිය වගකීම් ඉටුකරනු ලැබ ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

**සිරෝමි වික්‍රමසිංහ මිය**
සභාපතිනී
කොළඹ
2014

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එෆ්බී/එෆ්/එච්ඩීඑෆ්සී/එෆ්ඒ/2013
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2014 අප්‍රේල් 11 දින

සභාපති,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2003 අංක 15 දරන පනතින්ද, 2011 අංක 45 දරන පනතින්ද, සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ 26 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94 11 2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යයන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

1988 අංක 30 දරන බැංකු පනතට සහ එදිනට පසුකාලීන සංශෝධනයන් මගින් අවශ්‍ය කෙරෙන තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කරනු ලබයි.

**පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කෙරෙනු ඇත.

**අ/කෘ:එච්. ඒ. එස්. සමරවීර**
**විගණකාධිපති**

# ආදායම් ප්‍රකාශය

අගයයන් රුපියල් වලිනි

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| **ආදායම** | | **3,802,864,578** | 2,744,477,936 |
| පොළී ආදායම | 1 | **3,528,217,218** | 2,634,758,527 |
| පොළී වියදම | 2 | **(2,469,268,259)** | (1,805,321,967) |
| **ශුද්ධ පොළී ආදායම** | | **1,058,948,959** | 829,436,561 |
| ගාස්තු හා කොමිස් ආදායම | 3 | **189,946,905** | 58,458,381 |
| ගාස්තු හා කොමිස් වියදම් | | **-** | - |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | | **189,946,905** | 58,458,381 |
| ශුද්ධ වාණිජ ආදායම/(වියදම) | | **-** | - |
| මූල්‍යයමය මෙවලම් මගින් ශුද්ධ ලාභය/ අලාභය | | **-** | - |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත තීරණය කෙරෙන | | **-** | - |
| මූල්‍යයමය ආයෝජන මගින් ශුද්ධ ලාභය/ අලාභය | | **-** | - |
| වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ) | 4 | **84,700,454** | 51,261,027 |
| **මුළුමෙහෙයුම් ආදායම** | | **1,333,596,318** | 939,155,969 |
| අඩු කිරීම - ණය සහ වෙනත් අලාභ සඳහා හානි ගාස්තු | 5 | **86,608,211** | 1,496,477 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | | **1,246,988,107** | 937,659,492 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 6 | **586,159,242** | 458,115,188 |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය සහ හානිවීම | | - | - |
| වෙනත් වියදම් | 7 | **351,536,588** | 303,799,488 |
| **එකතු කළ අගයට මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | **309,292,277** | 175,744,815 |
| අඩුකිරීම ඃ මූල්‍යමය සේවාවන් මත එකතු කළ අගය මත බදු | 8 | **77,917,978** | 49,892,630 |
| **එකතු කළ අගය මත බදු වලට පසු මෙහෙයුම් ලාභය/අලාභය** | | **231,374,299** | 125,852,185 |
| අනුබද්ධ ආයතන සහ හවුල් ව්‍යාපාරයන්හි ලාභ කොටස | | **-** | - |
| **බදු වලට පෙර ලාභය/(අලාභය)** | | **231,374,299** | 125,852,185 |
| බදු වියදම් | 9 | **73,366,108** | 70,321,030 |
| **වසර සඳහා ලාභය/(අලාභය)** | | **158,008,190** | 55,531,155 |
| **වෙන් කළ යුතු ලාභය** | | | |
| කොටස් හිමිකරුවන් | | **158,008,190** | 55,531,155 |
| පාලනය කළ නොහැකි ඇල්ම | | **-** | - |
| | | **158,008,190** | 55,531,155 |
| **ලාභ මත කොටසක ඉපැයුම** | | | |
| කොටසක මූලික ඉපැයුම් | 10 | **2.44** | 0.86 |
| සාමාන්‍ය කොටසක් සඳහා හීග ඉපැයීම | | **-** | - |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 |
|---|---|---|
| **වසර සඳහා ලාභය** | **158,008,190** | 55,531,155 |
| **වෙනත් විස්තීර්ණ ආදායම/(වියදම)** | | |
| දේපළ පිරියත සහ උපකරණ සඳහා ප්‍රත්‍යාගණන සංචිත වල | | |
| වෙනස්කම් (සාධාරණ අගය වරණය යොදා ගනු ලැබුවේ නම්) | **-** | - |
| නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණන ලාභ සහ අලාභ | **26,881,713** | - |
| ලාභ සහ අලාභ (විදේශීය මෙහෙයුමක මූලයමය ප්‍රකාශන පරිවර්තනයෙන් උද්ගත වන) | **-** | - |
| විකිණීමට ඇති මූල්‍යමය වතකම් ප්‍රති මිණුම්ගත කිරීමෙන් ලාභ සහ අලාභ | **-** | - |
| මුදල් ප්‍රවාහ අවදානම් ලාභ සහ අලාභ | **-** | - |
| අඩුකිරීම ඃ වෙනත් සමස්ත ආදායමින් සංරචක ආශ්‍රිත බදු ආදායම / (වියදම) | **-** | - |
| **බදු පසු වෙනත් විස්තීර්ණ ආදායම** | **26,881,713** | - |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **184,889,903** | 55,531,155 |
| **වෙන් කළ යුතු ඃ** | | |
| කොටස් හිමිකරුවන් | **184,889,903** | 55,531,155 |
| පාලනයෙන් තොර පොළී | **-** | - |

# මූල්‍යමය තත්ව ප්‍රකාශය

අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි

| 2013 දෙසැම්බර් 31 දිනට | Notes | 2013 | 2012 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| මුදල් සහ මහ බැංකුවේ ඇති ශේෂයන් | 11 | **101,866,952** | 107,856,602 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම් | 12 | **275,283,764** | 872,144,634 |
| බැංකු සමග ශේෂයන් | 13 | **382,847,152** | 411,219,276 |
| ණය සහ වෙන් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් | 14 | **19,701,338,734** | 15,965,668,211 |
| මූල්‍ය ආයෝජන - කල්පිරීම දක්වා රඳවා ගත් | 15 | **5,841,394,243** | 2,287,725,326 |
| දේපළ පිරියත සහ උපකරණ | 16 | **289,536,996** | 288,119,377 |
| ආයෝජන දේපළ | 17 | **807,755,000** | 738,677,165 |
| විලම්භිත බදු වත්කම් | 18 | **12,521,930** | 23,128,512 |
| වෙනත් වත්කම් | 19 | **154,935,939** | 106,067,546 |
| **මුළු වත්කම්** | | **27,567,480,711** | 20,800,606,649 |
| **වගකීම්** | | | |
| බැංකු සහ වෙනත් ආයතන වෙත වගකීම් | 20 | **3,269,330,502** | 3,213,784,432 |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙත වගකීම් | 21 | **18,913,646,260** | 14,695,420,265 |
| නිකුත් කළ ණය සුරැකුම් | 22 | **1,982,358,158** | - |
| වර්තමාන බදු වගකීම් | 23 | **63,913,888** | 61,881,876 |
| වෙනත් වගකීම් | 24 | **763,007,280** | 438,312,992 |
| **මුළු වගකීම්** | | **24,992,259,088** | 18,409,399,566 |
| **කොටස්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 25 | **962,092,936** | 962,092,936 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 26 | **71,238,500** | 61,994,005 |
| රඳවාගත් ඉපැයුම් | 27 | **1,268,966,705** | 1,191,882,032 |
| වෙනත් සංචිත | 28 | **272,923,481** | 175,238,110 |
| මුළු කොටස් හිමියන්ගේ ස්කන්ධ | | **2,575,221,623** | 2,391,207,083 |
| **පාලනය කළ නොහැකි ඇල්ම** | | **-** | **-** |
| මුළු කොටස් | | **2,575,221,623** | 2,391,207,083 |
| **මුළු කොටස් හිමිකම් සහ වගකීම්** | | **27,567,480,711** | 20,800,606,649 |
| අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් | | **-** | - |
| කොටසක් සඳහා පොත් වටිනාකම | | **39.80** | 36.95 |

පිටු අංක 30 සිට 51 දක්වා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනයන්හි වැදගත් කොටසක් නිර්මාණය කරයි. මෙම මූල්‍යමය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුමකරණ සම්මතයන්ට අනුකූලව සකසා ඇත.

**ඩී වී පතිරණ**
ප්‍රධාන මූල්‍ය නිලධාරී

**නිමල් ජේ. බී. මාමඩුව**
ප්‍රවිනි/සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන් වෙනුවෙන් අත්සන් තබා අනුමත කරන ලද මෙම මූල්‍යමය ප්‍රකාශනයන් සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

**එස් එන් වික්‍රමසිංහ මිය**
සභාපති

**එල්.ඊ.එස්. සිල්වා**
අධ්‍යක්ෂ

11 අප්‍රියෙල් 2014
කොළඹ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි<br>දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | |
| ලද පොළිය | **3,320,032,832** | 2,512,109,154 |
| පොළී ගෙවීම් | **(3,187,649,403)** | (1,286,202,145) |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබුනු මුදල් | **129,679,162** | 54,393,085 |
| සේවකයින් සහ සැපයුම්කරුවන් වෙත ගෙවූ මුදල් | **(615,537,693)** | (513,865,159) |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් | **(278,761,236)** | (213,331,567) |
| මෙහෙයුම් වත්කම් වල වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | **(632,236,337)** | 553,103,368 |
| **මෙහෙයුම් වත්කම් වල (වැඩිවීම)/අඩු වීම** | | |
| ණුණුදෙනුකරුවන්ගෙන් අයකරගත් අරමුදල් | **3,171,099,579** | 2,705,212,439 |
| ණුණුදෙනුකරුවන් වෙත අත්තිකාරම් | **(6,818,831,356)** | (3,678,415,278) |
| වෙනත් වත්කම් | **26,876,730** | 20,456,990 |
| | **(3,620,855,047)** | (952,745,849) |
| **මෙහෙයුම් වගකීම් ඉහළ යාම්/(පහළ යාම්)** | | |
| ණුණුදෙනුකරුවන්ගේ තැන්පතු | **4,935,916,914** | 586,890,086 |
| වෙනත් | **300,788,095** | 31,642,908 |
| | **5,236,705,009** | 618,532,994 |
| අදායම් බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් | **983,613,624** | 218,890,512 |
| ගෙවන ලද ආදායම් බදු සහ උපකල්පිත ලාභාංශ බදු | **(34,590,653)** | (42,323,040) |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් | **949,022,972** | 176,567,472 |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| ලද ලාභාංශ | **17,857** | 17,857 |
| ආයොජන සුරැකුම් (මිළදී ගැනීම) විකිණීම | **(2,855,729,677)** | 283,184,107 |
| දේපළ පිරියත උපකරණ මිළදී ගැනීම | **(65,989,823)** | (94,026,260) |
| දේපළ පිරියත උපකරණ ඉවත් කිරීම | **800,815** | 3,102,830 |
| ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් | **(2,920,900,827)** | 192,278,534 |
| **මූල්‍ය සම්පාදන කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| කොටස් නිකුතුව/(නිදහස් කිරීම) | **-** | - |
| කොටස් ප්‍රාග්ධනය | **-** | - |
| ණය ලබා ගැනීම් නැවත ගෙවීම | **(2,492,491,361)** | (1,973,151,227) |
| ණය ලබාගැනීමේන් ලද මුදල් | **4,531,085,814** | 1,606,581,604 |
| ගෙවන ලද ලාංභාංශ | **-** | - |
| මූල්‍ය සම්පාදන ක්‍රියාකාකාරකම් වලින් ශුද්ධ මුදල් | **2,038,594,453** | (366,569,624) |
| මුදල් සහ මුදල් සමාන ද වල ශුද්ධ වර්ධනය | **66,716,597** | 2,276,382 |
| කාලපරිච්ඡේදය මුලදී මුදල් සහ මුදල් සමාන දෑ | **201,373,664** | 199,097,283 |
| කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | **268,090,261** | 201,373,664 |
| **මුදල් සහ මුදල් සමාන දෑ වල සැසඳුම** | | |
| අත ඇති මුදල් | **101,866,952** | 107,856,602 |
| බැංකු ගත මුදල් | **166,223,309** | 93,517,062 |
| | **268,090,261** | 201,373,664 |

# කොටස් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

31-12-2013 අවසන් වූ වසර සඳහා
බැංකුව:000

| අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි | ඡන්ද බලය හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | විශේෂ සංචිත | ආයෝජන අරමුදල | ආයුගණක ලාභ/අලාභ | රඳවාගත් ඉපැයුම්ට | එකතුව | පාලනය කළ නොහැකි ඇල්ම | මුළු කොටස් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01-01-2012 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 50,144 | 35,014 | 61,871 | 3,451 | 53,997 | | 1,169,978 | 2,336,549 | | 2,336,548,690 |
| වසර සඳහා මුළු සමස්ත ආදායම | - | | | | | | | | | | | |
| වසර සඳහා ලාභය/(අලාභය) | | | | | | | | | 55,533 | 55,533 | | 55,533 |
| වෙනත් සමස්ත ආදායම (බදු වලින් තොරව) | | | | | | | | | | | | |
| **වසර සඳහා මුළු සමස්ත ආදායම** | 64,710,520 | 962,093 | 50,144 | 35,014 | 61,871 | 3,451 | 53,997 | | 1,225,512 | 2,392,082 | | 2,392,082 |
| කොටස් තුළ සෘජුව හඳුනාගත් කොටස් හිමිකරුවන් සමග ගනුදෙනු | | | | | | | | | | | | |
| කොටස් නිකුතුව/මූලික ප්‍රාග්ධනය ඉහළ යාම | | | | | | | | | | | | |
| ප්‍රසාද නිකුතුව | | | | | | | | | | | | |
| හිමිකම් නිකුතුව | | | | | | | | | | | | |
| කාල පරිච්ඡේදය තුළ සංචිත වෙත මාරු කිරීම් | | | 245 | | 123 | | 33,262 | | -33,630 | - | | |
| ගෙවන ලද ලාභාංශ | | | | | | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය වෙත මාරු කළ ලාභය | | | | | | | | | | | | |
| දේපළ පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය/(අලාභය) (පිරිවැය ක්‍රමය යෙදී නම්) | | | | -875 | | | | | | -875 | | -875 |
| වෙනත් | | | | | | | | | | | | |
| **කොටස් හිමිකරුවන් සමග මුළු ගනුදෙනු** | | | 245 | -875 | 123 | | 33,262 | | -33,630 | -875 | | -875 |
| **31-12-2012 දිනට ශේෂය** | 64,710,520 | 962,093 | 50,390 | 34,139 | 61,994 | | 3,451 | 87,259 | 1,191,882 | 2,391,207 | | 2,391,207 |

| අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි | ඡන්ද බලය හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | විශේෂ සංචිත | ආයෝජන අරමුදල | ආයුගණක ලාභ/අලාභ | රඳවාගත් ඉපැයුම්ට | එකතුව | පාලනය කළ නොහැකි ඇල්ම | මුළු කොටස් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1-01-2013 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 50,390 | 34,139 | 61,994 | 3,451 | 87,259 | | 1,191,882 | 2,391,207 | | 2,391,207 |
| වසර සඳහා මුළු සමස්ත ආදායම | | | | | | | | | | | | |
| වසර සඳහා ලාභය/(අලාභය) | | | | | | | | | 158,008 | 158,008 | | 158,008 |
| වෙනත් සමස්ත ආදායම (බදු වලින් තොරව) | | | | | | | | 26,882 | | 26,882 | | 26,882 |
| **වසර සඳහා මුළු සමස්ත ආදායම** | 64,710,520 | 962,093 | 50,390 | 34,139 | 61,994 | 3,451 | 87,259 | 26,882 | 1,349,890 | 2,576,097 | | 2,576,097 |
| කොටස් තුළ සෘජුව හඳුනාගත් කොටස් හිමිකරුවන් සමග ගනුදෙනු | | | | | | | | | | | | |
| කොටස් නිකුතුව/මූලික ප්‍රාග්ධනය ඉහළ යාම | | | | | | | | | | | | |
| ප්‍රසාද නිකුතුව | | | | | | | | | | | | |
| හිමිකම් නිකුතුව | | | | | | | | | | | | |
| කාල පරිච්ඡේදය තුළ සංචිත වෙත මාරු කිරීම් | | | 18,489 | | 9,244 | | 53,190 | | -80,924 | | | |
| ගෙවන ලද ලාභාංශ | | | | | | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය වෙත මාරු කළ ලාභය | | | | | | | | | | | | |
| ලාභය/(අලාභය) (පිරිවැය ක්‍රමය යෙදී නම්) | | | | -875 | | | | | | -875 | | -875 |
| ලාභය/(අලාභය) (පිරිවැය ක්‍රමය යෙදී නම්) | | | | | | | | | | | | |
| වෙනත් | | | | | | | | | | | | |
| **කොටස් හිමිකරුවන් සමග මුළු ගනුදෙනු** | | | 18,489 | -875 | 9,244 | | 53,190 | 26,882 | -80,924 | -875 | | -875 |
| **31-12-2013 දිනට ශේෂය** | 64,710,520 | 962,093 | 68,878 | 33,264 | 71,239 | 3,451 | 140,449 | 26,882 | 1,268,967 | 2,575,222 | | 2,575,222 |

# ගිණුම්කරණ ප්‍රමිතීන්

**ආයතනික තොරතුරු**

**1 වාර්තාකරණ ආයතනය**

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 1956 ජාතික නිවාස පනතෙහි 11 වැනි වගන්තිය යටතේ 1984දී ඉදිකිරීම් සමාගමක් වශයෙන් ශ්‍රී ලංකාවේ සංස්ථාපිතය. ඉන් අනතුරුව 1997 අංක 7 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත යටතේ සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලද අතර 2003 අංක 15 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත (සංශෝධිත) යටතේ විශේෂිත බැංකු තත්වය අත්පත් කරගත් අතර, 2011 සංශෝධිත පනත් අංක 45 යටතේ 1988 බැංකු පනතේ අංක 30 සහ ඉන් අනතුරුව සිදුකෙරුනු සංශෝධන ප්‍රකාර උපලේඛණයේ සියළුම ක්‍රියාකාරකම් සිදුකිරීමට අනුමැතිය හිමි විය. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාව, කොළඹ 2 හි ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි ලේකම් කාර්යාලයේ පිහිටා ඇත.

**2 ප්‍රධාන ක්‍රියකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය**

වසර තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි ආර්ථික සංවර්ධනයට දායක වෙමින් ණය ලබාදීම සහ තැන්පතු එක්රැස් කිරීමයි.

**3 පිලියෙළ කිරීමේ පදනම**

**3.1 අනුගත වීමේ ප්‍රකාශනය**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් දක්වා ඇති ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, අනෙකුත් සවිස්තරාත්මක ආදායම් පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිනුම් ප්‍රතිපත්ති සහ සටහන් වලින් සමන්විත වේ. මූල්‍යමය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත.

මෙම මූල්‍යමය ප්‍රකාශන සැකසීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් සියළුම විශේෂිත ව්‍යාපාර ආයතන සඳහා හඳුන්වා දී ඇති ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිතීන් යොදා ගැණිනි. සන්සන්දනාත්මක අගයන්ද ඉහත ප්‍රමිතීන් අනුව නැවත දක්වා ඇත.

**වැටයීම**

මූල්‍යමය ප්‍රකාශනයන්හි අගයයන් වෙනත් අයුරකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 1 ''මූල්‍යමය ප්‍රකාශන ඉදිරිපත් කිරීම'' මගින් අනුමත කොට ඇති පරිදි ආසන්නතම රුපියලට වටයනු ලැබ ඇත.

**ගිණුම් ආකෘතිය සහ පෙර වසරෙහි අගයයන්**

මූල්‍යමය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිර්දේශිත ගිණුම් ආකෘතිය අනුව ඉදිරිපත් කොට ඇති අතර බැංකුව මගින් යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රමිතීන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 1 ''මූල්‍යමය ප්‍රකාශන ඉදිරිපත් කිරීම'' මගින් අනුමත කොට ඇති පරිදි පෙර මූල්‍ය වසරෙහි ප්‍රමිතීන්ට ගැළපේ. කෙසේවුවද මූල්‍යමය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධිත අවස්ථාවන්හිදී වර්තමාන වසර තහවුරු කරනු පිණිස සන්සන්දනාත්මක අගයයන්ද නැවත වර්ගීකරණය කරනු ලැබේ.

**4 වත්කම් තක්සේරුකරණය**

**4.1 ගනුදෙනුකරුවන් වෙත ණය සහ අත්තිකාරම් ඃ**

ගනුදෙනුකරුවන් වෙත ණය සහ අත්තිකාරම් සිදුවිය හැකි ණය අලාභ සඳහා හානිවීමේ අලභ හැර මූල්‍යමය තත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇත.

**4.2 හානිවීමේ අලාභ සඳහා වෙන් කිරීම**

හානිවීමේ අලාභ සඳහා වෙන් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 'මූල්‍යමය උපකරණ ඃ බැංකුවල මූල්‍යමය ප්‍රකාශනයන් තුළ ඇගයීම සහ මිණුම්කරණය' අනුව අඛණ්ඩ විමර්ශන පදනමක් මත සිදුකෙරිණි. ණය වල සාධාරණ වටිනාකම තීරණය කිරීම සඳහා පහත දක්වෙන ක්‍රමවේදයන් යොදා ගැණිනි.

1 සාමුහික හානිකරණය
2 කේවල හානිකරණය

**4.2.1. සාමුහික හානිකැණය**

සිදුවිය හැකි ණය අලාභ සඳහා සමුහ හානිවීමේ වෙන්කිරීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 'මූල්‍යමය උපකරණ ඃ බැංකුවල මූල්‍යමය ප්‍රකාශනයන් තුළ ඇගයීම සහ මිණුම්කරණය' අනුව සිදු කෙරිණි. කේවල හානි වීම සිදු කළ නොහැකි අවස්ථාවන්හිදී බැංකුව මගින් සාමුහික හානිවීමේ වෙන්කිරීම චක්‍රීය අනුපාත ක්‍රමය මත යොදා ගැණිනි.

**උකස් සහ ඇපකාර ණය**

හානි වීම ගැලපීම සඳහා සම්මත චක්‍රීය අනුපාත ක්‍රමය යොදා ගැනුනු අතර ගෙවීම පැහැර හැරීම් සිදු නොකළ ගනුදෙනුකරුවන් සඳහා වෙන්කිරීමක් සිදු නොකෙරිණි.

**මුදල් ආන්තික ණය**

මුදල් ඇප ණය බැංකුවේ අභිමතය පරිදි අයකර ගත හැකි බැවින් මුදල් තැන්පතු ශේෂයන් මත ණය සඳහා වෙන් කිරීම් සිදු නොකෙරිණි.

**සේවක අර්ථසාධක අරමුදල් ණය**

සේවක අර්ථසාධක අරමුදල් ණය සඳහා සමුහ හානිවීමේ ක්‍රමවේදය යොදා ගැනුනු අතර ගෙවීම පැහැර හැරීම් සිදු නොකළ ගනුදෙනුකරුවන් සඳහා වෙන්කිරීමක් සිදු නොකෙරිණි. මාස 18 දක්වා හිඟ මුදල් සම්බන්දයෙන්

බැංකුව 0-3 පරාසයට අදාළ චක්‍රී අනුපාතය යොදා ගනී. ගෙවීම පැහැර හැරීමේ කාණ්ඩය මාස 18ට වැඩි නම් අදාළ කාණ්ඩයට ගැළපෙන චක්‍රීය අනුපාතය බැංකුව මගින් යොදා ගැණිනි.

**අලෙවිය සඳහා වන අත්පත් කරගත් දේපළ**

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් තබන ලද දේපළ සැලකියයුතු කාලයක් ගනුදෙනුකරුවන් විසින් ගෙවීම පැහැර හරින ලද අවස්ථාවන් හිදී වෙන්දේසි කෙරෙන අතර එවැනි වෙනදේසි වලිදී ඉවත් නොකෙරෙන දේපළ අත්පත් කරගත් දේපළ වශයෙන් සළකා ණය සහ අත්තිකාරම් යටතේ දැක්වේ.

එවැනි දේපළ වල තක්සේරුකරණය පහත දැක්වේ.

- සාධාරණ තහවුරුවක් සමගින් මුදල් ප්‍රවාහ ගණනය කෙරෙන්නේ නම් කේවල හානිවීම ගණනය කෙරේ.
- මුදල් ප්‍රවාහ සඳහා සාධාරණ තහවුරුවක් සිදු නොකෙරේ නම් අත්පත් කරගත් දේපළ වලට එරෙහිව ණය සඳහා 100% හානි වීම යොදා ගැනේ.
- ව්‍යාපෘති ණය
- පැහැර හැරීම් සිදු නොකළ ගනුදෙනුකරුවන් සඳහා වෙන්කිරීමක් සිදු නොකෙරුනි. මුදල් අයකරගැනීම සඳහා සාධාරණ තහවුරුවක් සහිත ගෙවීම පැහැර හරිද ලද ණය සඳහා හානිවීමේ වෙන්කිරීමක් සිදු කෙරිනි.

**4.2.3 මූල්‍යමය ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් වල, බැඳුම්කරණයන්හි සහ කල්පිරීම තෙක් රඳවාගත් ආයෝජනයන් ලැබිය යුතු පිරිවැය සහ පොළිය අනුව දැක්වේ.

**4.3 දේපළ පිරියත සහ උපකරණ**

මේවා මූලිකව වත්කම් ඒවායේ භාවිත කළ හැකි තත්වයට ගෙන ඒම සඳහා අවශ්‍ය පිරිවැය සහ වෙනත් වියදම් වශයෙන් හෝ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අදාළ 16 අනුව වසර 3කට නොවැඩි නවතම තක්සේරු වාර්තාව යොදා ගනිමින් සාධාරණ අගය මත වාර්තා කෙරේ.

**4.3.1. හඳුනාගැනීමේ පදනම**

අදාළ වත්කම සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත හිමිවිය හැකිනම් සහ වත්කමෙහි පිරිවැය විශ්වසනීය අයුරින් මැනිය හැකි නම් දේපළ පිරියත සහ උපකරණ හඳුනාගැනේ.

**4.3.2 මිනුම්කරණ පදනම**

ස්ථාවර පිරිවැය හෝ තක්සේරුකරණය සමග අදාළ වත්කම් ඒවායේ කාර්ය තත්වයට ගෙනඒම සඳහා වැය වන ඕනෑම සෘජුව යෙදිය හැකි පිරිවැයක් සමගින් වාර්තා කෙරේ දේපළ සහ උපකරණ සමුච්චිත ක්ෂය හැර පිරිවැය විවිධ වර්ගයේ වත්කම් වල ඇස්තමේන්තුගත ආයුකාලය සම්බන්ධ සෘජු රේඛීය පදනම මත ක්ෂයවීම පහත දැක්වෙන අනුපාත අනුව දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂය තුල නව තක්සේරු වාර්තා ලබාගෙන නොමැත.

| වත්කම් වර්ගය | වසරකට % |
|---|---|
| ගොඩනැගිලි | 62/3 |
| කාර්යාල උපකරණ | 12.50 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10.00 |
| මෝටර් රථ සහ බයිසිකල් | 20.00 |
| පිරියත සහ යන්ත්‍ර | 25.00 |
| මෙවලම් | 12.50 |
| පරිගණක උපකරණ සහ ස්වයංකීය ටෙලර් යන්ත්‍ර | 12.50 |
| පරිගණක මෘදුකාංග - විදේශීය | 25.00 |
| පරිගණක මෘදුකාංග - දේශීය | 25.00 |

වසර තුළ මිළදී ගත් සහ භාවිත කළ වත්කම් සඳහා වාර්ෂික ක්ෂය වීම් දක්වා ඇති අතර ඉවත් කිරීමේ වසර සඳහා ක්ෂයවීම් දක්වා නොමැත තවද සින්නක්කර ඉඩම් සඳහා ක්ෂයවීම් දක්වා නොමැත.

**5 ආයෝජන දේපළ**

ආයෝජන දේපළ වර්තමාන වෙළඳපළ වටිනාකම අනුව වාර්තා කොට ඇති අතර පවතින වටිනාකම සහ වෙළඳපළ වටිනාකම අතර වෙනස වෙනත් ආදායම් වාර්තාවේ දක්වා මූල්‍යමය තත්වය යටතේ සමූහකරණය කොට ඇත.

**6 වගකීම් සහ වෙන්කිරීම්**

**6.1 ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු මුදල්**

මෙයට පොළිය සහිත තැන්පතු ඉතුරුම් තැන්පතු කාලීන තැන්පතු ඉල්ලීම පරිදි ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු සහතික ඇතුළත් වේ. මෙම තැන්පතු සඳහා ගෙවිය යුතු පොළිය ක්‍රමක්ෂය පිරිවැය පදනම මත ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කොට අදාළ වගකීම් යටතේ ඉදිරිපත් කෙරේ.

**6.2 ණය ලබා ගැනීම්**

ප්‍රති මූල්‍ය ණය ලබාගැනීම් ඇමතුම් මූල්‍ය ණය ලබාගැනීම් සහ මූල්‍ය ආයතන වෙතින් ණය ලබාගැනීම් ඇතුළත් ණය ලබාගැනීම් හිඟ ශේෂයෙහි දළ වටිනාකම අනුව දැක්වේ. ඒවා මූල්‍යමය ප්‍රකාශනයෙහි ගෙවිය යුතු මුදල් වශයෙන් දැක්වේ. මෙම ණය ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය යොදා ගනිමින් ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කෙරේ.

**6.3 විශ්‍රාම ප්‍රතිලාභ - නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්**

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා වෙන් කිරීම සිදුකෙරේ. බැංකුවෙහි වසර 15 කට අධික සේවා කාලයක් සහිත

විශේෂ සේවකයින් හට CBEU සාමූහික ගිවිසුම අනුව විශේෂ පාරිතෝෂික වෙන් කිරීමක් සිදු කෙරේමෙම අයිතමය මූල්‍ය තත්ව ප්‍රකාශනයන්හි වෙනත් වගකීම් යටතේ සමූහකරණය කෙරේ.

**6.4 විශ්‍රාම ප්‍රතිලාභ - නිර්වචනය කරන ලද දායකත්ව සැලසුම්**

**6.4.1 සේවක අර්ථසාධක අරමුදල**

සේවක අර්ථසාධක අරමුදල ව්‍යවස්ථා හා රෙගුලාසිවලට අනුගාමීව සේවක අර්ථසාධක අරමුදලට බැංකුව සේවක වැටුපෙන් 12% සහ 8% වශයෙන් දායක වේ.

**6.4.2. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල බැංකුව සේවක වැටුපෙන් 3% වශයෙන් දායක වේ.

**6.5 වෙනත් වගකීම්**

වෙනත් වගකීම් යටතට ගාස්තු වියදම් සහ පාරිතෝෂික ගෙවීම් සහ වෙනත් වෙන් කිරීම් ඇතුළත් වේ මෙම වගකීම් මූල්‍යමය තත්ව දිනයේදී ගෙවීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණයන් වශයෙන් වාර්තා කෙරේ.

**7 ආදායම් හඳුනාගැනීම**

**7.1 ණය සහ අත්තිකාරම් මත පොළී ආදායම**

සඵල පොළී අනුපාත ක්‍රමය යොදාගනිමින් සියළුම ණය සඳහා උපචිත පදනමක් මත පොළී ආදායම හඳුනාගැනේ.

**7.2 කල් ගතවූ පොළී ආදායම**

ණය වාරික ප්‍රමාද වී ගෙවීම් සඳහා කල්ගතවූ පොළී ආදායම සේ.අ.අ.ණය හැර ණය සඳහා මුදල් පදනමක් මත හඳුනාගැනේ.

**7.3 රාජ්‍ය සුරැකුම් සහ ආයෝජනයන්ගෙන් ආදායම**

භාණ්ඩාගාර බිල්පත් සහ භාරයන් මත වට්ටම්/වාරික ආයෝජන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කෙරේ.

**7.4 වෙනත් ආදායම**

කොමිස් ආදායම වර්තමාන ණය සඳහා ගෙවීමට ඇති මුදල් පදනමක් මත වාර්තා කෙරෙන අතර වෙනත් ආදායම් මුදල් පදනමක් මත හඳුනාගැනේ.

**8 වියදම්**

**8.1 තැන්පතු සහ ණය ගැනීම් මත පොළිය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 'මූල්‍යමය උපකරණ ඃ බැංකුවල මූල්‍යමය ප්‍රකාශනයන් තුළ හඳුනාගැනීම සහ මිණුම්කරණය' අනුව තැන්පතු සහ ණය ගැනීම් මත පොළී පිරිවැය සඵල පොළී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ආදායම් ප්‍රකාශකයට ඇතුළත් කෙරේ.

**8.2 වෙනත් වියදම්**

දේපළ පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා සිදුකරන ලද සියළු වියදම් වසර සඳහා ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කෙරෙන අතර ගෙවිය යුතු මුදල් පදනම මත හඳුනාගැනේ.

**9 බදුකරණය**

වර්තමාන වසරෙහි බදු සහ විලම්භිත බදු වලින් ශුද්ධව ආදායම් බදු වියදම දැක්වේ. කොටස් වලදී ඍජුව හඳුනාගැනෙන අයිතම හැර ආදායම් බදු වියදම ආදායම් ප්‍රකාශනය තුල හඳුනාගැනේ.

**9.1 පවත්නා බදු**

පවත්නා බදු වත්කම් සහ වගකීම් වර්තමාන වසරේදී මෙන්ම පෙර වසර වලදී බදු අධිකාරීන් වෙත ගෙවීමට හෝ අයකර ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණයන්ගෙ න් සමන්විත වේ. අගයයන් ගණනය කිරීම සඳහා යොදා ගැනුනු බදු නීති රීති මූල්‍ය තත්ව දිනය වන විට ක්‍රියාත්මක ඒවා වේ ඒ අනුව 2006 අංක 10 දරණ ආදායම් බදු පනත ප්‍රකාර වසර තුළ ලාභය සඳහා බදු වෙන්කිරීමක් සිදු කොට බදුකරණ අරමුණු සඳහා සකසන ලදී. සටහනෙහි 'ආදායම් බදු' සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 අවශ්‍යතාවය පරිදි බදු වියදමෙහි ප්‍රධාන සංරචකයන් බලාත්මක බදු අනුපාත සහ බදු පෙර ලාභය සහ බදු වියදම අතර සමෝධානයක් ඉදිරිපත් කෙරේ.

**9.2 විලම්භිත බදු**

විලම්භිත බදු වගකීම් ක්‍රමය අනුව දක්වා ඇත ආදායම් බදු අරමුණු සඳහා අයිතම වෙත අනුමැතිය සහිතව මූල්‍යමය ප්‍රකාශනයන්හි හඳුනාගන්නා කාලපරිච්ඡේදයට වඩා වෙනස් කාලයක හඳුනාගැනීමේදී, ආදායම් බදු සඳහා අනුමත අයිතමයන්හි කාල වෙනසෙහි බදු බලපෑම වර්තමාන බදු අනුපාතය මත විලම්භිත බදු සඳහා වෙන්කිරීම වශයෙන් මූල්‍යමය ප්‍රකාශනයන්හි ඇතුළත් කෙරේ.

**9.3 මූල්‍යමය සේවාවන් මත එකතු කළ අගය මත බදු**

මූල්‍යමය සේවාවන් මත එකතු කළ අගය මත බදු ගණනය කිරීමේ පදනම වනුයේ සේවකයින් වෙත ප්‍රතිලාභ ගෙවීමට සහ ආදායම් බදු වලට පෙර ගිණුම්ගත ලාභය වන අතර එය දක්වා ඇති අනුපාත මත ගණනය කරන ලද ක්ෂය වීම් සඳහා ගළපනු ලැබේ. කාලපරිච්ඡේදය සඳහා ලාභය තීරණය කිරීමේදී අය කෙරෙන එකතු කළ අගය මත බදු ප්‍රමාණය මූල්‍යමය ප්‍රකාශනයන්හි දැක්වේ.

**10 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 7 අනුව 'ඍජු ක්‍රමය' යොදා ගනිමින් සිදු කෙරිණි. එහිදී මෙහෙයුම් ක්‍රියාකාරකම් ආයෝජන ක්‍රියාකාකරකම් සහ මූල්‍යමය ක්‍රියාකාරකම් මත දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගැනේ.

**11 ව්‍යවස්ථාපිත සංචිත අරමුදල**

ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධානයන් අනුව බදු වලින් පසු ශුද්ධ ලාභයෙන් 5%ක් ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරු කෙරේ.

ලාභාංශ බෙදාදීමට පෙර ශුද්ධ ලාභයෙන් 10%ක් පොදු සංචිතය වෙත මාරු කෙරේ.

**12 සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ**

සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ වගකීමක් වශයෙන් හඳුනාගෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් අනුමත කිරීමෙන් පසු හිමිකම් වලින් අඩු කෙරේ.

වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය සඳහා අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශිත සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ මූල්‍යමය ප්‍රකාශයන්ගෙන් වෙන්ව දක්වේ.

**13 කොටසක මූලික ඉපැයුම**

කාල පරිච්ඡේදය සඳහා හිඟ බර තබන ලද සාමාන්‍ය කොටස් වල සාමාන්‍යය මත බැංකුව මගින් සාමාන්‍ය කොටස් කරුවන් වෙත ලාභය හෝ අලාභය බෙදීමෙන් කොටසක මූලික ඉපැයුම තීරණය කෙරේ.

සියළුම සිදුවිය හැකි සාමාන්‍ය කොටස් අවප්‍රමාණ වීම් සඳහා ගැලපීමෙන් පසු කාල පරිච්ඡේදය සඳහා හිඟ බර තබන ලද සාමාන්‍ය කොටස් වල සාමාන්‍යය මත බැංකුව මගින් සාමාන්‍ය කොටස් කරුවන් වෙත ලාභය හෝ අලාභය බෙදීමෙන් අවප්‍රමාණිත කොටසක මූලික ඉපැයුම තීරණය කෙරේ.

**14 තොග තක්සේරුකරණය**

පරිභෝජනය කළ හැකි තොග පිරිවැය මත වාර්තා කොට ඇති අතර තොග අයිතම සම්බන්ධ ගැටළු පළමු ඇතුළත් වීම් පළමු පිටවීම් ක්‍රමය (FIFO) මත තීරණය කෙරේ.

**15 දැනට යොදා නොගත් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන්**

පහත දක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරනු ලැබ ඇති අතර 2014 ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසු ඇරඹෙන කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක වේ.

(i) ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිති අංක 9 - මූල්‍යමය උපකරණ

සිය මුදල් ප්‍රමාණයන් කාලසීමාවන් සමාගමෙහි අනාගත මුදල් ප්‍රවාහයන්හි අස්ථාවරත්වය තක්සේරු කිරීම සඳහා මූල්‍යමය ප්‍රකාශයන් භාවිත කරන්නන් හට ප්‍රයෝජනවත් සහ අදාළ තොරතුරු සැපයීම සඳහා මූල්‍යමය වත්කම් හා වගකීම් සම්බන්ධ මූල්‍යමය වාර්තාකරණය සඳහා ප්‍රමිතීන් ස්ථාපනය කිරීම මෙම ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිතියෙහි අරමුණ වේ. මෙම ප්‍රමිතියේ බලය දැණුම් දෙන තුරු බලාත්මක නොවේ.

(ii) ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිති අංක 10 - ඒකාබද්ධ මූල්‍යමය ප්‍රකාශන

කිසියම් සමාගමක් මගින් වෙනත් සමාගම් එකක් හෝ කිහිපයක් පාලනය කරනු ලබන අවස්ථාවකදී ඒකාබද්ධ මූල්‍යමය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිපත්ති ස්ථාපනය කිරීම මෙම ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිතියෙහි අරමුණ වේ. ප්‍රමිතියේ බලාත්මක දිනය 2014 ජනවාරි 1 වේ.

(iii) ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිති අංක 11 - බද්ධ මෙහෙයුම්

බද්ධව පාලනය වන සමාගම් වල මෙහෙයුම් ආශ්‍රිත මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධ ප්‍රමතීන් ස්ථාපනය කිරීම මෙම ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිතියෙහි අරමුණ වේ.

මෙම ප්‍රමිතිය සඳහා බලාත්මක දිනය 2014 ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසු ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්ට අයත් වේ.

(iv) ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිති අංක 12 - වෙනත් සමාගම්හි වගකීම් අනාවරණය කිරීම

මෙම ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිතියෙහි අරමුණ වනුයේ කිසියම් සමාගමක මූල්‍යමය ප්‍රකාශනයන් භාවිත කරන්නන් හට අදාළ සමාගම සම්බන්ධ පහත දක්වෙන කරුණු සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා තොරතුරු අනාවරණය කිරීමේ අවශ්‍යතාවය අදාළ සමාගම වෙත නිර්මාණය කිරීමයි.

අ) එහි වෙනත් සමාගම් තුළ පවතින වගකීම් ආශ්‍රිත අවදානම් සහ ස්වභාවයන්ඃ සහ

ආ) එහි මූල්‍යමය තත්වය, මූල්‍යමය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ කෙරෙහි අදාළ වගකීම් වල බලපෑම

මෙම ප්‍රමිතිය සඳහා බලාත්මක දිනය 2014 ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසු ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්ට අයත් වේ.

(V) ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිති අංක 13 - සාධාරණ අගය මිනුම්කරණය

සාධාරණ අගය ඒ සම්බන්ධ මිනුම් ආශ්‍රිත අනාවරණයන් සිදුකිරීම අවශ්‍ය හෝ අනුමත අවස්ථාවන් හිදී ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිතීන් යටතේ එය සිදුකළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ මෙම ප්‍රමිතිය මගින් සපයනු ලැබේ. මෙම ප්‍රමිතිය සඳහා බලාත්මක දිනය 2014 ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසු ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්ට අයත් වේ.

# මූල්‍යමය උපකරණ ඇගයීම

2013 බැංකුව - වර්තමාන වසර

| අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි | හුවමාරුව සඳහා පවතින | සාධාරණ අගයට ලාභ ලාභ ගිණුම් හරහා පෙන්වූ | කල්පිරෙනතෙක් පවතින | ණය අත්තිකාරම් හා ලැබිය යුතු | විකිණීම සඳහා පවතින | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| මහ බැංකු වල පවතින මුදල් හා ශේෂයන් | | | | | | 101,866,952 | 101,866,952 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම් | | | 275,283,764 | | | | 275,283,764 |
| බැංකුවල පවතින ශේෂයන් | | | 382,847,152 | | | | 382,847,152 |
| ව්‍යුත්පන්න මූල්‍ය මෙවලම් | | | | | | | - |
| හුවමාරුව සඳහා රඳවා ගත් මූල්‍ය වත්කම් | | | | | | | - |
| සාධාරණ අගය මත ලාභාලාභ ගිණුම හරහා පෙන්වූ මූල්‍ය වත්කම් | | | | | | | - |
| බැංකු වෙත ලැබිය යුතු ණය අත්තිකාරම් | | | | | | | - |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ලැබිය යුතු ණය අත්තිකාරම් | | | | 19,701,338,734 | | | 19,701,338,734 |
| මූල්‍යමය ආයෝජන | | | 5,841,394,243 | | | | 5,841,394,243 |
| වෙනත් වත්කම් | | | | | | | - |
| මුළු මූල්‍යමය වත්කම් | - | - | 6,499,525,159 | 19,701,338,734 | - | 101,866,952 | 26,302,730,845 |
| වෙනත් වත්කම් | | | | | | 1,264,749,866 | 1,264,749,866 |
| මුළු වත්කම් | - | - | 6,499,525,159 | 19,701,338,734 | - | 1,366,616,818 | 27,567,480,711 |

| අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි | හුවමාරුව සඳහා පවතින | සාධාරණ අගයට ලාභ ලාභ ගිණුම් හරහා පෙන්වූ | කල්පිරෙනතෙක් පවතින | ණය අත්තිකාරම් හා ලැබිය යුතු | විකිණීම සඳහා පවතින | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **වගකීම්** | | | | | | | |
| බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන වෙත | | 3,269,330,502 | | | | | 3,269,330,502 |
| ව්‍යුත්පන්න මූල්‍ය මෙවලම් | | | | | | | - |
| සාධාරණ අගය මත ලාභාලාභ ගිණුම හරහා පෙන්වූ මූල්‍ය වත්කම් | | | | | | | - |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවීම් | | | 18,913,646,260 | | | | 18,913,646,260 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | | | 1,982,358,158 | | | | 1,982,358,158 |
| වෙනත් වගකීම් | | | | | | | - |
| මුළු මූල්‍යමය වගකීම් | - | - | 24,165,334,921 | - | - | - | 24,165,334,921 |
| වෙනත් වගකීම් | | | | | | 3,402,145,790 | 3,402,145,790 |
| මුළු වගකීම් | - | - | 24,165,334,921 | - | - | 3,402,145,790 | 27,567,480,711 |

2012 බැංකුව - පෙර වසර

| අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි | හුවමාරුව සඳහා පවතින | සාධාරණ අගයට ලාභ ලාභ ගිණුම් හරහා පෙන්වූ | කල්පිරෙනතෙක් පවතින | ණය අත්තිකාරම් හා ලැබිය යුතු | විකිණීම සඳහා පවතින | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **මහ බැංකු වල පවතින මුදල් හා ශේෂයන්** | | | | | | | |
| මහ බැංකු වල පවතින මුදල් හා ශේෂයන් | | | | | | 107,856,602 | 107,856,602 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම් | | | 872,144,634 | | | | 872,144,634 |
| බැංකුවල පවතින ශේෂයන් | | | 411,219,276 | | | | 411,219,276 |
| ව්‍යුත්පන්න මූල්‍ය මෙවලම් | | | | | | | - |
| හුවමාරුව සඳහා රඳවා ගත් මූල්‍ය වත්කම් | | | | | | | - |
| සාධාරණ අගය මත ලාභාලාභ ගිණුම හරහා පෙන්වූ මූල්‍ය වත්කම් | | | | | | | - |
| බැංකු වෙත ලැබිය යුතු ණය අත්තිකාරම් | | | | | | | - |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ලැබිය යුතු ණය අත්තිකාරම් | | | | 15,965,668,211 | | | 15,965,668,211 |
| මූල්‍යමය ආයෝජන | | | 2,287,725,326 | | | | 2,287,725,326 |
| වෙනත් වත්කම් | | | | | | | - |
| මුළු මූල්‍යමය වත්කම් | - | - | 3,571,089,236 | 15,965,668,211 | - | 107,856,602 | 19,644,614,049 |
| වෙනත් වත්කම් | | | | | | 1,155,992,600 | 1,155,992,600 |
| මුළු වත්කම් | - | - | 3,571,089,236 | 15,965,668,211 | - | 1,263,849,202 | 20,800,606,649 |

| අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි | හුවමාරුව සඳහා පවතින | සාධාරණ අගයට ලාභ ලාභ ගිණුම් හරහා පෙන්වූ | කල්පිරෙනතෙක් පවතින | ණය අත්තිකාරම් හා ලැබිය යුතු | විකිණීම සඳහා පවතින | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **වගකීම්** | | | | | | | |
| බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන වෙත | | | 3,213,784,432 | | | | 3,213,784,432 |
| ව්‍යුත්පන්න මූල්‍ය මෙවලම් | | | | | | | - |
| සාධාරණ අගය මත ලාභාලාභ ගිණුම හරහා පෙන්වූ මූල්‍ය වගකීම් | | | 14,695,420,265 | | | | 14,695,420,265 |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවීම් | | | | | | | - |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | | | | | | | - |
| වෙනත් වත්කම් | | | | | | | - |
| මුළු මූල්‍යමය වගකීම් | - | - | 17,909,204,697 | - | - | - | 17,909,204,697 |
| වෙනත් වගකීම් | | | | | | 2,891,401,951 | 2,891,401,951 |
| මුළු වගකීම් | - | - | 17,909,204,697 | - | - | 2,891,401,951 | 20,800,606,649 |

## 1. පොළී ආදායම

| | බැංකුව | |
|---|---|---|
| රුපියල් වලින් | **2013** | 2012 |
| **පොළී ආදායම** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම් | **28,416,192** | 13,190,178 |
| බැංකුවල පවතින ශේෂයන් | **-** | - |
| ව්‍යුත්පන්න මූල්‍ය මෙවලම් | **-** | - |
| හුවමාරුව සඳහා රඳවා ගත් මූල්‍ය වත්කම් | **-** | - |
| සාධාරණ අගය මත ලාභාලාභ ගිණුම හරහා හඳුනාගත් | **-** | - |
| මූල්‍යමය වත්කම් | **-** | - |
| බැංකු වෙතින් ලැබිය යුතු ණය අත්තිකාරම් | **-** | - |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ලැබිය යුතු ණය අත්තිකාරම් | **2,922,126,138** | 2,277,680,253 |
| මූල්‍යමය ආයෝජන - කල්පිරීම තෙක් රඳවාගත් | **577,674,889** | 343,888,096 |
| මූල්‍යමය ආයෝජන - විකිණීම සඳහා පවතින | **-** | - |
| වෙනත් | **-** | - |
| **මුළු පොළී ආදායම** | **3,528,217,218** | 2,634,758,527 |

## 2. පොළී වියදම්

| | බැංකුව | |
|---|---|---|
| රුපියල් වලින් | **2013** | 2012 |
| බැංකු වෙත ගෙවිය යුතු මුදල් | **144,780,900** | 124,159,138 |
| ව්‍යුත්පන්න මූල්‍ය මෙවලම් | **-** | - |
| සාධාරණ අගය මත ලාභාලාභ ගිණුම හරහා හඳුනාගත් | **-** | - |
| කරන ලද මූල්‍යමය වගකීම් | **-** | - |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවීම් | **2,160,642,968** | 1,561,107,148 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | **58,466,955** | - |
| වෙනත් ණය ලබාගැනීම් | **105,377,437** | 120,053,669 |
| **මුළු පොළී වියදම්** | **2,469,268,259** | 1,805,321,967 |

## 3. ගාස්තු සහ කොමිස් ආදායම

| | බැංකුව | |
|---|---|---|
| රුපියල් වලින් | **2013** | 2012 |
| ගාස්තු සහ කොමිස් ආදායම | **189,946,905** | 58,458,381 |
| වෙනත් | **-** | - |
| **ගාස්තු සහ කොමිස් ආදායම** | **189,946,905** | 58,458,381 |
| සමන්විත වන ආකාරය | | |
| ණය | **165,739,838** | 48,341,506 |
| කාඩ්පත් | **-** | - |
| වාණිජ සහ විදේශ මුදල් ප්‍රේෂණ | **-** | - |
| ආයෝජන බැංකුකරණය | **-** | - |
| තැන්පතු | **-** | - |
| ඇපකර | **-** | - |
| වෙනත් | **24,207,067** | 10,116,875 |
| **ගාස්තු සහ කොමිස් ආදායම** | **189,946,905** | 58,458,381 |

## 4. වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)

| රුපියල් වලින් | බැංකුව 2013 | 2012 |
|---|---|---|
| ප්‍රත්‍යාගණන ලාභය ආයෝජන දේපළ | **95,413,312** | 53,081,000 |
| ප්‍රත්‍යාගණන (අලාභය) ආයෝජන දේපළ | **-** | - |
| ආයෝජන දේපළ විකිණීමෙන් අලාභය | **(10,712,858)** | (1,819,973) |
| වෙනත් | **-** | - |
| **වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)** | **84,700,454** | 51,261,027 |

2012 වසරේ ආයෝජන දේපල ප්‍රත්‍යගණන ලාභය වූ රුප්යල් මිලියන 53 ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 40 - ආයෝජන දේපල ප්‍රමිතියට අනුකූලවන පරිදි වෙනත් ආදායම් යටතේ නැවත වර්ගීකරණය කරන ලද අතර ඒ හේතුවෙන් සමුච්චිත ඉපයීම් රුපියල් මිලියන 53 කින් ඉහළ ගිය අතර ප්‍රත්‍යගණන සංචිතය රුපියල් මිලියන 53 කින් පහළ ගියහ.

## 5. ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ පිරිවැය

| රුපියල් වලින් | බැංකුව 2013 | 2012 |
|---|---|---|
| ණය සහ ලැබිය යුතු මුදල් | | |
| බැංකු වෙතින් | **-** | - |
| වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් | **86,608,211** | 1,496,477 |
| වෙනත් | **-** | - |
| එකතුව | **86,608,211** | 1,496,477 |

### 5.1 වෙනත් ගනුදෙනුකරුවන් වෙත

| | | |
|---|---|---|
| කේවල හානිකරණ | **(33,635,984)** | (11,128,270) |
| සාමූහික හානිකරණ | **120,244,196** | 12,624,747 |
| | **86,608,211** | 1,496,477 |

## 6. කාර්ය මණ්ඩල පිරිවැය

| රුපියල් වලින් | බැංකුව 2013 | 2012 |
|---|---|---|
| **වැටුප් සහ ආශ්‍රිත වියදම්** | | |
| වැටුප් සහ ප්‍රසාද දීමනා | **413,493,341** | 318,911,611 |
| සේවක ණය ප්‍රතිලාභ | **33,637,428** | 16,212,647 |
| සේවක වෛද්‍යාධාර ප්‍රතිලාභ | **19,656,295** | 18,138,032 |
| අතිකාල සහ නිලධාරීන්ගේ දීමනා | **6,058,808** | 6,947,752 |
| වාර්ෂික ඉතිරි නිවාඩු මත ගෙවීම් | **11,546,750** | 9,470,816 |
| දිරි දීමනා | **5,079,453** | 4,513,811 |
| කොටස් ආශ්‍රිත වියදම් | **-** | - |
| වෙනත් | **-** | - |
| | **489,472,074** | 374,194,668 |
| **විශ්‍රාම ප්‍රතිලාභ** | | |
| නිත්‍ය දායකත්ව සැලසුම් සඳහා දායකත්වයන් | **48,004,616** | 42,740,828 |
| නිත්‍ය ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වයන් | **48,682,553** | 41,179,693 |
| | **96,687,168** | 83,920,521 |
| එකතුව | **586,159,242** | 458,115,188 |

### 6.1 ප්‍රධාන කළමනාකාරීත්වයේ පාරිශ්‍රමිකයන්

| රුපියල් වලින් | බැංකුව 2013 | 2012 |
|---|---|---|
| ප්‍රධාන කළමනාකාරීත්වයේ මුළු වැටුප | **22,437,628** | 22,979,464 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම | **1,464,836** | 2,267,375 |
| | **23,902,463** | 25,246,838 |

### 6.2 ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය - විශේෂ පාරිතෝෂිකය

